## G.C.E. (A/L) – 2004 –CORRECT RESPONSES/PHYSICS MCQ PAPER

(1) ALL
(2) 2
(3) ALL
(4) 2
(5) 1
(6) 3
(7) 4
(8) 1
(9) 2
(10) 3

(11) 2
(12) 1
(13) 1
(14) 3
(15) 1
(16) 1
(17) 4
(18) 2
(19) 5
(20) 3

(21) 3
(22) 1
(23) 3
(24) 1
(25) 5
(26) 3
(27) 5
(28) 2
(29) 5
(30) 4

(31) 2
(32) 1
(33) 1
(34) 1
(35) 4
(36) 5
(37) 3
(38) 2
(39) 5
(40) 4

(41) 4
(42) 3
(43) 5
(44) 2
(45) 3
(46) 3
(47) 3
(48) 4
(49) 2
(50) 4

(51) 4
(52) 4
(53) 2
(54) 5
(55) 1
(56) 2
(57) 4
(58) 3
(59) 4
(60) 1



Scanned by CamScanner

අසන්නට ලැබුණු තොරතුරු අනුව නම් බහුවරණ ප්‍රශ්ණ පත්‍රය දරුවන්ට අමාරු වී ඇත. දෙවන ප්‍රශ්ණ පත්‍රය දූ දරුවන්ට එතරම් දුෂ්කර වූ බවක් පෙනෙන්නට නොතිබුණි.

01.පළමු ප්‍රශ්ණය දකපු සැණින් දරුවන් උඩ යන්නට ඇත. විශේෂයෙන්ම ලඝු ප්‍රශ්ණයක්, ප්‍රශ්ණයේ අඩංගු නිසා මෙය බොහෝ දරුවන්ට පැටළුණු බව නම් සහතික කළ හැක. ප්‍රශ්ණයේ අඩුපාඩුවක් ඇත. C නියතයක් ලෙස සඳහන් කර ඇතත් එය මාන රහිත නියතයක් ලෙස සඳහන් කර නැත. එමනිසාය උත්තරය ALL ලෙස සැලකීමට සිදුවී ඇත්තේ. C මාන රහිත නියතයක් ලෙස සැලකුවහොත් උත්තරය සෙවීම අපහසු නැත. සෑමවිටම ලඝු (log) ගණිත කර්මය යෙදෙන ප්‍රකාශණයකට කිසිවිටක මාන තිබිය නොහැක. මෙහිදී ද $I/I_0$ ට මාන නොමැති බව එකවිටම පෙනේ. log( ), ln( ) හා ඕනෑම සංඛ්‍යාවක බලයකට (දර්ශකයකට) මාන තිබිය නොහැක. (උදා: $10^{()}$, $e^{()}$) මෙහි ln යන්නෙන් දක්වා ඇත්තේ e පාදයට ලඝු ගත් විට භාවිත වන සංකේතයයි. log යනු දහයේ පාදයට ලඝු ගත් විට යොදන සාමාන්‍ය සංකේතයයි. ln පිළිබඳ දැනුම අනවශ්‍යය. විකිරණශීලතා සමීකරණය වන $N = N_0e^{-\lambda t}$ ප්‍රකාශණයේ දෙපස e පාදයට ලඝු ගත් විට $\ln N = \ln N_0 - \lambda t$ ලෙස ලිවිය හැක. මේවා පිළිබඳ අධ්‍යයනය අවශ්‍ය නැත. නමුත් ඕනෑම පාදයකට ගත් බලයක අඩංගු ප්‍රකාශණයට මාන නොමැති බව දැනගැනීම වැදගත්ය. උදාහරණයක් වශයෙන් ඉහත ප්‍රකාශණයේ $\lambda t$ ගුණිතයට මාන තිබිය නොහැක.
ප්‍රශ්ණ පත්‍රයේ අඩංගු ප්‍රකාශණයේ C හා log කොටසේ මාන නොමැති නිසා ප්‍රකාශණයේ දකුණු පසටද මාන තිබිය නොහැක. එමනිසා q/KT ට වෝල්ටීයතාවයේ පරස්පරයේ මාන තිබිය යුතුය. එනම්, KT/q හි මාන V හි මාන විය යුතුය. C මාන රහිත නියතයක් යැයි කියා දී තිබුනේ නම් නිවැරදි උත්තරය (5) වේ.

02.මෙහි අඩංගු ප්‍රකාශ නම් මීට පෙර නොයෙක් අවස්ථාවලදී පරීක්ෂා කර ඇත. විද්‍යුත් චුම්බක තරංග තීර්යක් තරංග බව ප්‍රසිද්ධ සත්‍යයකි. (A) සත්‍යය. (A) සත්‍ය නම් (C) නිකම් ම අසත්‍ය විය යුතුය. තීර්යක් තරංගයක විචලනය වන දෙය තරංගය ප්‍රචාරණය වන දිශාවට ලම්බකව සිදුවිය යුතුය. (B) ප්‍රකාශය අසා ඇති වාර ගණන අසීමිතය. එය සත්‍යය.

03.මෙම ප්‍රශ්ණයේ ද පොඩි අඩුපාඩුවක් ඇත. දුර වෙනුවට සඳහන් විය යුත්තේ විස්ථාපනයය. ප්‍රවේග ගැන කථා කළ හැක්කේ විස්ථාපනය හා සම්බන්ධවය. අනෙක් අතට දුරක් සෘණ විය නොහැකි බවටද තර්කයක් ගොඩනැගිය හැක. S විස්ථාපනය ලෙස ගතහොත් නිවැරදි පිළිතුර වන්නේ, (3) ය. අසන්නේ ප්‍රවේගයෙහි විශාලත්වය පමණි. එමනිසා ලකුණ ගැන (+හෝ -) සැලකීම අනවශ්‍යය. එබැවින් සෙවිය යුත්තේ අවම අනුක්‍රමණය (බෑවුම) හා උපරිම අනුක්‍රමණය ඇති අවස්ථාය. A හි අනුක්‍රමණය ශූන්‍යය. උපරිම බෑවුමක් (නැග්මක්) ඇත්තේ (D) හි අඩංගු සරල රේඛාවටය. අවම හා උපරිම ප්‍රවේග නිරූපණය කරන්නේ කුමණ ප්‍රස්ථාරද ?

04.මෙයත් හුරු පුරුදු ගැටළුවකි. අවලම්බිත සිරස් රේඛාව ඔස්සේ ගුරුත්ව කේන්ද්‍රය පිහිටිය යුතුය. රාමුවේ ගුරුත්ව කේන්ද්‍රයේ පිහිටුම ඉතා සරලව නිමානය කළ හැක. Q දණ්ඩේ ස්කන්ධය P හි හෝ R හි හෝ ස්කන්ධය මෙන් දෙගුණයක් බව සැළකිය යුතුය. මමත් ප්‍රථමයෙන් කියවූ විට මෙය නොසලකා හරින ලදී. P හා R දඬු දෙකේ ගුරුත්ව කේන්ද්‍රය ඒවාහි මධ්‍ය ලක්ෂ්‍ය යාකරන රේඛාවේ හරිමැද පිහිටයි. Q හි ස්කන්ධය P හා R හි ස්කන්ධ එකතුවට සමාන නිසා සංයුක්තයේ ගුරුත්ව කේන්ද්‍රය පිහිටන්නේ Q හි මධ්‍ය ලක්ෂ්‍යය හා ඉහත සඳහන් ලක්ෂ්‍යය අතර හරි මැදය. X හරහා යන සිරස් රේඛාව පහළට දික්කොට රූපවල ඇඳ ගැනීමෙන් උත්තරය පහසුවෙන් සොයා ගත හැක. (1) හා (5) නම් එක එල්ලේම ඉවත් කළ හැක. රූප ඇඳ ඇති ආකාරයට (3) හා (4) පැහැදිලි වෙනසක් නැත. නිවැරදි උත්තරය (2) වේ. දඬුවල ස්කන්ධ සමාන ලෙස ගතහොත් (3) රූප සටහන තෝරාගැනීම වැලැක්විය නොහැක.

05.මෙහි ඇත්තේ සරළ අනුවර්තීය චලිතයක දත ගත යුතු theory වේ. (1) හැර ඉතිරි වගන්ති වැරදි බව වටහා ගත යුතුය. (1) හරිය. දුන්නක් අදින්න අදින්න අමාරු වන්නේ මේ නිසාය. බලය සෑමවිටම එල්ල වන්නේ සමතුලිත පිහිටුම වෙතය. දුන්නක් ඇද අත හැරිය විට ද සංකෝචනය කර අත හැරිය විට ද නැවත මුල් සමතුලිත පිහිටීමට ඒමට කැමතිය. දෝලන සංඛ්‍යාතය හා විස්තාරය අතර සම්බන්ධයක්



Scanned by CamScanner

නැත. සමානුපාතික සීමාව ඉක්ම නොයන්නේ නම් දුන්නක් අඩුවෙන් ඇද්දත් වැඩියෙන් ඇද්දත් දෝලන සංඛ්‍යාතය වෙනස් නොවේ. සරල අවලම්බය හැසිරෙන්නේ ද මේ ලෙසමය. මුළු ශක්තිය විස්තාරයේ වර්ගයට සමානුපාතිකය. මුළු ශක්තිය විභව හා චාලක ශක්ති අතර අඩු වැඩි වේ. විභව ශක්තිය අඩුවන විට චාලක ශක්තිය වැඩිවේ. චාලක ශක්තිය අඩුවන විට විභව ශක්තිය වැඩිවේ.

06. මෙයත් ඉතා සරල පෙර දී ඇති වගන්ති වේ. (A) වැරදිය. සංඛ්‍යාතය වෙනස් නොවේ. (B) නිවැරදිය. එනම් ප්‍රිස්මය තුළදී විවිධ වර්ණ විවිධ වේග වලින් ගමන් කරයි. රතු ආලෝකයේ වේගය නිල්වලට වඩා වැඩිවේ. ඒ අනුව රතු ආලෝකයේ අපගමනය නිල්වලට වඩා අඩුවේ.

නිල් ආලෝකයේ වර්තන කෝණය රතුවලට වඩා අඩුය.




$$\frac{\text{Sin i}}{\text{Sin r}} = \frac{\text{වාතයේදී වේගය}}{\text{මාධ්‍යයේදී වේගය}}$$

$$V_R > V_B \Longrightarrow r_R > r_B$$

(B) හා (C) වගන්ති සත්‍ය වේ.

07. විලායක (fuse) කෙළින්ම A/L විෂයය නිර්දේශයේ නැතත් මෙය සාමාන්‍ය දැනීමේ ප්‍රශ්ණයකි. භෞතික විද්‍යාව හදාරන දරුවෙක් fuse යන එක ගැන දන්නේ නැතිනම් එය ලැජ්ජා වියයුතු කරුණකි. ගෘහස්ථ විදුලි සැපයුම 250 V ලෙස ගතහොත් ගණනයකින් තොරව උත්තරය ලබාගත හැක. 250 V , 1 kW නම් ධාරාව, 4 A වේ. (1000/250) නමුත් සාමාන්‍ය ගෘහස්ථ වෝල්ටියතාව 230 V පමණ වන නිසා (250 V ට අඩු) 5 A විලායකයක් දැමීම ඇහට ගුණය. 4 ට වැඩි ඉතාම සමීප පිළිතුර 5 ය.

08. මෙය $E = mc^2$ යෙදීමෙන් විසදිය යුතු ගැටළුවකි.

$2.1 \times 10^9 = m \times 9 \times 10^{16}$ $\quad m \approx 0.23 \times 10^{-7}$ kg/s $\approx 0.023$ mg/s

සරළ ගණනයක් අවශ්‍යය. $c^2$ ඉතා විශාල අගයක් ගන්නා නිසා ඉතාම කුඩා ස්කන්ධයකින් (එය සම්පූර්ණයෙන්ම වැනසිය හැකියැයි සිතා) ඉතා විශාල ශක්ති ප්‍රමාණයක් නිපදවිය හැක. එමනිසා බලාපොරොත්තු විය යුත්තේ තත්පරයකට ඉතා කුඩා ස්කන්ධයකි.

09. මෙය නොයෙක් විට අසා ඇති ප්‍රශ්ණයකි. සම්ප්‍රයුක්ත බලය ගම්‍යතා වෙනස්වීමේ සීඝ්‍රතාවයට සමානය. එමනිසා ගම්‍යතා වෙනස්වීම $= 10 \times 10 \times 10^{-3} = 0.1$ වේ. ඇත්තටම ගණනයක් අවශ්‍ය නැත. මනෝමයෙන් කළ හැක.

10. මෙයද නොයෙක් විට අසා ඇති ප්‍රශ්ණයකි. වස්තුව නිශ්චලව ඇති තාක් කල් ඝර්ෂණ බලය යොදන බලයට සමානය. චලිත වීම ඇරඹුණු පසු එය ස්වල්පයක් අඩු වේ. (ගතික ඝර්ෂණය) එවැනි හැඩහුරුවක් නිරූපණය කරන එකම එක ප්‍රස්ථාරය (3) පමණි.

11. කෙටි ක්‍රමයක් හඳුනා නොගතහොත් සෑහෙන කාලයක් නාස්ති විය හැකි ප්‍රශ්ණයකි. බැලූ බැල්මට නිවැරදි බවට නිගමනය කළ හැක්කේ (1) සහ (5) පමණි. මට සිතෙන හැටියට මෙයට පිළිතුර සෙවීමට ඇති කෙටි ක්‍රමය පතන කිරණයට සමාන්තරව ප්‍රකාශ කේන්ද්‍රය හරහා යන කිරණය නිර්මාණය කිරීමය. පහත රූපය බලන්න.



(1) (2) (3) (4) (5)



Scanned by CamScanner

(1) සිට (4) දක්වා රූපවල ප්‍රකාශ කේන්ද්‍රය හරහා පතන කිරණවලට සමාන්තරව රේඛා ඇඳ ඇත. අවතල කාචයකට සමාන්තර ආලෝක කදම්බයක් (ප්‍රධාන අක්ෂයට සමාන්තර නොවූ) පතිත වූ විට ඒවා නාභි තලයේ පිහිටි යම් ලක්ෂ්‍යයකින් අපසාරී වන්නාක් සේ පෙනිය යුතු බව අපි දනිමු. එමනිසා කිරණ සටහන නිවැරදි නම් වර්තිත කිරණය ආපස්සට දික්කල විට එය ප්‍රකාශ කේන්ද්‍රය හරහා අපගමනය නොවී යන කිරණය කොහේදී හෝ හමුවිය යුතුය. මේ තර්කය අනුව (2) රූප සටහන වැරදි බව එක එල්ලේ පෙනේ. එහි වර්තිත කිරණය ආපසු දික්කල විට ප්‍රකාශ කේන්ද්‍රය හරහා යන කිරණය කිසිවිටෙක නොකැපේ. (1), (3) හා (4) මා ඉදිරිපත් කළ නීතිය පිළිපදී. මෙය නිරාකරණය කරගැනීමට වෙනත් ක්‍රම (අභිසාරී/අපසාරී බව හෝ එක් එක් පෘෂ්ඨයෙන් සිදුවන වර්තනය සැළකීම) ඇත. නමුත් මට නම් මේ ක්‍රම පැටළිලි සහිතය. මෙවැනි ගැටළු ලිහීමට මා ඉදිරිපත් කර ඇති ක්‍රමය 100% ක් ප්‍රත්‍යක්ෂය. දර්පණ සඳහා ද මෙම ක්‍රමය මේ ආකාරයෙන්ම යෙදවිය හැක.

12. මෙය නම් සෑම ප්‍රශ්ණ පත්‍රයකටම පාහේ ඇති ප්‍රශ්ණයකි. ප්‍රශ්ණය කියවන සැනින්ම පිළිතුර (1) බව පැහැදිලි වේ. ඈතින් පැමිණෙන කිරණ 1 m දුරකින් එනවා සේ ඇසට දනිය යුතුය.

13. මෙයත් පහසු ප්‍රශ්ණයකි. ලෝහයක ප්‍රතිරෝධය/ප්‍රතිරෝධකතාව උෂ්ණත්වය සමග වැඩිවේ. සිලිකන් අර්ධ සන්නායකයකි. අර්ධ සන්නායක ප්‍රතිරෝධය/ප්‍රතිරෝධකතාව උෂ්ණත්වය වැඩිවන විට අඩුවේ. පෘෂ්ඨික ආතතිය සහ දුස්ස්‍රාවීතාව උෂ්ණත්වය වැඩිවන විට අඩුවන රාශීන්ය. උෂ්ණත්වය වැඩිවන විට වසා ඇති කාමරයක සාපේක්ෂ ආර්ද්‍රතාව අඩුවේ. කාමරය තුළ ඇත ජල වාෂ්ප ස්කන්ධය නියතයකි. උෂ්ණත්වය වැඩිවන විට කාමරය සංතෘප්ත කිරීමට අවශ්‍ය වන ජල වාෂ්ප ස්කන්ධය වැඩිවේ. එමනිසා සාපේක්ෂ ආර්ද්‍රතාව අඩුවේ.

14. මෙම ප්‍රශ්ණය නව රටාවක ප්‍රශ්ණයකි. මේ මාදිලියේ ප්‍රශ්ණ කිහිපයක් ප්‍රශ්ණ පත්‍රයේ ඇත. මෙම ප්‍රශ්ණ දකපු හැටියේ මට සිතුනේ වගන්ති දෙකම අසත්‍ය විය යුතු කියාය. නමුත් එක් වගන්තියක් වැරදීම පමණක් සෑහේ. පෝටෝනවල රික්තයේදී ඇත්තේ එකම වේගයකි. (ආලෝකයේ වේගය) පෝටෝන වෙනුවට විද්‍යුත් චුම්බක තරංග කියා සැළකුවද වරදක් නැත. ඉලෙක්ට්‍රෝනවල විවිධ වේග තිබිය හැක. විද්‍යුත් ක්ෂේත්‍ර මගින් ඉලෙක්ට්‍රෝන ත්වරණය හෝ මන්දනය කළ හැක. සංඛ්‍යාතය අනුව පෝටෝනවල ශක්තිය වෙනස් වේ. ඉලෙක්ට්‍රෝනවල විවිධ වේග ගත හැකි නම් විවිධ ශක්තීන්ද ගත හැකි වේ. පෝටෝනවල ආරෝපණයක් නැති නිසා විද්‍යුත් ක්ෂේත්‍ර හෝ චුම්බක ක්ෂේත්‍රවලින් උත්ක්‍රමණය කළ නොහැක. ඉලෙක්ට්‍රෝන එසේ නොවේ. පෝටෝන සහ ඉලෙක්ට්‍රෝන දෙකටම අංශු සහ තරංග ලෙස හැසිරිය හැක. පෝටෝනවලට සමහර ද්‍රව්‍යවලින් ඉලෙක්ට්‍රෝන විමෝචනය කළ හැක. ප්‍රකාශ විද්‍යුත් ආවරණය මෙයට හොඳ උදාහරණයකි. ඉලෙක්ට්‍රෝන හදිසියේ නැවැත්වීම මගින් හානිවන ශක්තිය පෝටෝනවලට හැරවිය හැක. X කිරණ නිෂ්පාදනය කදිම උදාහරණයකි. මෙම ප්‍රශ්ණයේ විෂයය නිර්දේශයට අයත් බොහෝ කරුණු පරීක්ෂා කෙරේ. එකවිටම විද්‍යුත් ක්ෂේත්‍ර මගින් පෝටෝන උත්ක්‍රමණය කළ නොහැක යන්න ඇස ගැටුනහොත් උත්තරය ඉතා ඉක්මණින් ලබාගත හැක. මෙය මීට පෙර පරීක්ෂා කර ඇත.

15. මෙය Theory ය. $F = i l B \sin\theta$ මගින් නිවැරදි පිළිතුර (1) බව වැටහේ. සෑම ගැටලුවකම පාහේ $\theta = 90^0$ අවස්ථාව සැලකුවත් බලය $\theta$ මත රඳා පවතින බව මතක තබාගත යුතුය. $\theta = 0$ නම්, එනම් චුම්බක ක්ෂේත්‍රයේ දිශාව කම්බියට සමාන්තර නම් බලය ශූන්‍ය වේ.

16. මෙය වෙන කිසිවක් නොව වීස්ටන් පරිපථයක් බව හඳුනාගත් විට උත්තරය අතේය.
ප්‍රශ්න පත්‍රයේ ඇති පරිපථය හා මෙය එකම නොවේදැයි බලන්න.
කෝෂය හා 50 Ω එකිනෙකින් හුවමාරු කල හැකි බව දන්නා කරුණකි.
මෙය පෙර ප්‍රශ්න පත්‍රයක අසා ඇත. නිවැරදි උත්තරය (1) වේ.






Scanned by CamScanner

17. කියවීමට බොහෝ කරුණු ඇතත් කියවාගෙන යනවිට උත්තරය පැහැදිලිවම පෙනේ. (1), (2), (3), හා (5) ඉතාම සත්‍ය බව එකවිටම තීරණය කළ හැක. ගැල්වනෝමීටරය හා ශ්‍රේණිගතව විශාල ප්‍රතිරෝධයක් සම්බන්ධ කිරීම සංතුලන අවස්ථාව ලබා ගැනීමේ නිරවද්‍යතාව අඩු කරයි. විශාල ප්‍රතිරෝධයක් ශ්‍රේණිගතව සම්බන්ධ කිරීම ගැල්වනෝමීටරයේ ආරක්ෂාවට හොඳය.

18. මෙය බැලූ බැල්මට දුෂ්කර ප්‍රශ්නයක් වුවත් ඉතා පහසුය. මෙවැනි ප්‍රශ්නයක් පෙරද අසා ඇත. අවශ්‍ය වන්නේ අවස්ථිති ඝූර්ණය වැඩිම හා අඩුම රෝද තෝරා ගැනීමය. ස්කන්ධ ව්‍යාප්තිය රෝදවල කෙලවරට වැඩියෙන් සාන්ද්‍රවී පවතින්නේ A රෝදයේය. ඊළඟට (C) ය. (C) රෝදයේ දාරයේ (rim) මෙන්ම ඇතුලතත් ද්‍රව්‍ය ව්‍යාප්ත වී ඇත. අවස්ථිති ඝූර්ණය අඩුම (B) හිය. එම නිසා (B) ඉක්මනටම පතුළට පැමිණේ ඊළගට එන්නේ C ය. අන්තිමටම එන්නේ අවස්ථිති ඝූර්ණය වැඩිම වන A ය.

19. මෙයත් ඉතාම සරලය. දකපු ගමන් බ'නුලි මතක් වේ. හරස්කඩ වර්ගඵලය වැඩි නම් ජලය ගලායන වේගය ද වැඩිය. වේගය වැඩි නම් පීඩනය අඩුය. (පීඩනමාන නළවල පහල කෙලවරවල් ඇත්තේ එකම තිරස් මට්ටමේය) පීඩනය වැඩිම වන්නේ වර්ග ඵලය වැඩි තැනය. රූපයේ වර්ග ඵල වැඩිම තැනේ සිට අඩුම තැන කරා ඇස් රැගෙන යෑමය කළ යුත්තේ. එවිට නිවැරදි උත්තරය (5) බව ඉබේටම වැටහේවි.

20. ඉතාම සරලය. ABC ත්‍රිකෝණයේ වර්ග ඵලය සෙවිය යුතුය. මීට පෙර අවුරුදු වලදී මෙවැනි P-V වක්‍ර පිළිබඳව දත ගත යුතු සියලු දෑ අධ්‍යයනය කොට ඇත. මනෝමයෙන් සෑදිය හැක. පාදවල දිග පරෙස්සෙමින් ගත යුතුය. $(^1/_2 \times 2V \times 3P) \Rightarrow 3PV$

21. අමාරුවට පෙනුනද සරලය. n දිගක් ලෙස ගන්න. එය n + 1 වූයේ නම් දිගෙහි වැඩි වීම 1 ය.
[(n + 1)- n] දන් රේඛීය ප්‍රසාරණතාවයේ අර්ථ දක්වීමට අනුව,

$$\text{රේඛීය ප්‍රසාරණතාව} = \frac{\text{වැඩිවූ දිග}}{\text{මුල් දිග} \times \text{වැඩිවූ උෂ්ණත්වය}}$$

$$2 \times 10^{-5} = \frac{1}{n \times 1} \qquad n = 5 \times 10^4$$

දහරයේ දිග සොයන්න ගියොත් නම් අලි අමාරුවක වැටේ.

22. ඉතාම සරලම සරලය. පරිමාව එකමය. උෂ්ණත්වය එකමය. ස්කන්ධ එකමය. ඉතින් පීඩන සමානුපාතික වන්නේ එක් එක් වායුවෙහි සාපේක්ෂ පරමාණුක ස්කන්ධවලට නොවේද ?
$P \propto \frac{1}{M}$ උත්තරය නිකම්ම (1) ය.

23. මෙම ප්‍රශ්නයම පසුගිය ප්‍රශ්න පත්‍රයක ඇත. තහඩුව තුනී නිසා ධාරිතාවේ කිසිදු වෙනසක් සිදු නොවේ. තහඩු වර්ගඵලය A හා පරතරය d වන සමාන්තර තහඩු ධාරිත්‍රයක තහඩු අතරට ඝනකම t ලෝහ තහඩුවක් ඇතුලු කළවිට පද්ධතියේ සඵල ධාරිතාව $\frac{\varepsilon_0 A}{d - t}$ වන බව ඔබ ඔප්පු කොට ඇතුවාට සැක නැත. එයිනුත් t = 0 වන විට $C = \frac{\varepsilon_0 A}{d}$ වන බව පැහැදිලි වේ.
නමුත් මෙවැනි සූත්‍ර අනවශ්‍යය. ප්‍රශ්නයේ රූපය දුටු සැනින්ම උත්තරය මතක් වේ.

24. සමීකරණ ලියා සාදනවා නම් වැඩේ ටිකක් දුර දිග යයි. ගම්‍යතා සංස්ථිතිය හා චාලක ශක්තිය සංස්ථිති කළ යුතුය. සමාන ස්කන්ධ ඇති නම් ප්‍රත්‍යාස්ථ ගැටුමකදී පැමිණෙන ස්කන්ධය නැවතී නිශ්චලව තිබූ ස්කන්ධය තමා සමග ගැටුනු ස්කන්ධයේ වේගය ලබාගනී. සමහර ප්‍රදර්ශණවල ඇති ලෝහ බෝල වල සට්ටනයත් ඔබ දැක ඇතුවාට සැක නැත. සමීකරණ ලියනවා නම්,

$U = V_1 + V_2$ m සමාන නිසා සමීකරණවල m ලියා නැත. මෙය විසඳූ විට පිළිතුර ලැබේ.
$U^2 = V_1^2 + V_2^2$ දෙවන සමීකරණයේ $V_1$ සඳහා පළමු සමීකරණයෙන් ආදේශ කරන්න.



Scanned by CamScanner

25. ඉතාම සරලය. කිසිදු ගණනයක් අවශ්‍ය නැත. සංතුලන අවස්ථාවේදී P කෝෂය තුළින් ධාරාවක් නොගලයි. එමනිසා P හා සමග ශ්‍රේණිගතව ප්‍රතිරෝධයක් සම්බන්ධ කළා කියා සංතුලන දිගට කිසිදු වෙනසක් සිදු නොවේ. නිවැරදි පිළිතුර (5) ය. සමාන්තරගතව ප්‍රතිරෝධයක් සම්බන්ධ කරන අවස්ථාව ගැන බලන්නවත් ඕනෑ නැත. ප්‍රශ්නයට නිවැරදි පිළිතුරු දෙකක් තිබීමට නොහැකි නිසාය ඒ. P සමග සමාන්තරගතව ප්‍රතිරෝධයක් සම්බන්ධ කළ විට කෝෂය හරහා ධාරාවක් ගැලීමට පටන් ගනී. එමනිසා P හරහා විභව බැස්ම එහි වි.ගා. බලයට වඩා අඩුවේ. එබැවින් $l$ හි අගය අඩු විය යුතුය.

26. නැවතත් කිසිදු ගණනයක් අවශ්‍ය නැත. මනෝමයෙන් සෑදිය හැක. XY හා සමග ඇති 50 Ω හරහා ධාරාවක් නොගලයි. ඇත්තටම එම 50 Ω වලින් වැඩක් නැත. එම නිසා අනෙක් 50 Ω හරහා විභව බැස්ම සෙවුවොත් වැඩේ හරිය. කෝෂ සම්බන්ධ කොට ඇති ආකාරයට ඒවාහි වි.ගා. බල එකතු වේ. එම නිසා අවශ්‍ය පිළිතුර $\frac{15}{150} \times 50 = 5$.

27. ශ්‍රේණිගත උත්තර දිහා බැලීමටවත් අවශ්‍ය නැත. එවිට ධාරාව අඩු වන බැවිනි ඒ. ධාරාව තුන් ගුණයකින් වැඩි කළයුතු නම් සමක ප්‍රතිරෝධය තෙගුණයකින් අඩු කළ යුතුය. R, R/3 කළ යුතු නම් සමාන්තරගතව සම්බන්ධ කළ යුතු R, R ට වඩා අඩු විය යුතුය. R ම වුවහොත් සමකය R/2 වේ. R ට වඩා අඩු එකම එක උත්තරය ඇත්තේ (5) හිය.

28. සරල ගණනයක් අවශ්‍යය. $\frac{240 \times 240}{60} \times 6 \times \frac{5}{1000 \times 60} = 0.48$

කිලෝවොට්-පැය යනු ශක්තියේ ඒකකයක් බව මතක තබාගත යුතුය.
කිලොවොට්-පැය 1 = 1000 x 60 වොට්-මිනිත්තු.

29. සරල ක්‍රමය නම් K (බල නියතය) යංමාපාංකය ඇසුරින් ප්‍රකාශ කර ගැනීමයි.
$E = \frac{FL}{Al}$ එමනිසා $K = \frac{EA}{L}$ වේ. ($F = Kl$ නිසා) දුන් උත්තරය අතේය.
$E\uparrow K\uparrow, A\uparrow K\uparrow, L\downarrow K\uparrow$ සියල්ල සත්‍යය.




30. මේ හා ආශ්‍රිත ගැටලු ඕනෑ තරම් සාදා ඇතිවාට සැක නැත.
එවැනි ගැටලුවකදී $T \propto$ තන්තුවේ දිග ($l$) බවට වැටහී ඇතුවාට සැක නැත.
එබැවින් $l \rightarrow 2l$ කළවිට $T \rightarrow 2T$ වේ. නැති නම් එක් වරක් ගැටලුව සාදන්න. $T \propto r \propto l$

31. නිව්ටන්ගේ තෙවන නියමය හා ආශ්‍රිත බල ලකුණු කිරීමේ ප්‍රශ්ණයකි. ගවයා කකුලෙන් පොළොව තෙරපයි. එමනිසා $F_G$ පොළව තුළට විය යුතුය. $F_L$ සමාන හා ප්‍රතිවිරුද්ධ ක්‍රියාව වේ. මිනිසා කඹය අදියි. කඹය මිනිසා අදියි. නිවැරදි පිළිතුර (2) වේ. මෙම බල එකම ලක්ෂ්‍යයකදී ඇඳ තිබුණත් ඒවා ක්‍රියා කරන්නේ එකම වස්තුව මත නොවන බව මතක තබා ගන්න. මෙවැනි ගැටළුවකදී සෑම උත්තරයක් ම දෙස බැලීමට අවශ්‍ය නැත. X ට අදාල නිවැරදි රූප සටහන් පළමුව තෝරාගන්න. ඒ අනුව ඉතිරි වන්නේ, (1) හා (2) පමණි. Y ට අදාල රූප බැලිය යුත්තේ (1) හා (2) හි පමණි.



32. ගණනයක් අවශ්‍යය. අතාත්වික වස්තුව තාත්ත්වික ප්‍රතිබිම්බය යන සංකල්පය මත කිරණ ප්‍රත්‍යවර්ත කිරීමෙන් ගැටළුව සෑදිය හැක.

$$1/10 - 1/8 = 1/f$$
$$f = -40$$

33. සරල ගැටළුවකි. ස්ථාවර තරංගයේ තරංග ආයාමය L/2 බව රූපයෙන්ම පෙනේ.

$$\sqrt{\frac{Mg}{m}} = f\frac{L}{2}$$



Scanned by CamScanner

34. P හිදී සිදුවන්නේ මෘදු පරාවර්තනයක් හා B තුළට සම්ප්‍රේශණයකි. මෘදු පරාවර්තනයක් නිසා A තුළට පරාවර්තනය වන්නාවූ ස්පන්දය යටිකුරු නොවේ. මෙමගින් (4) හා (5) වරණ ඉවත් කළ හැක. B තුළට සම්ප්‍රේශණය වන්නාවූ ස්පන්දය කිසිවිටෙක යටිකුරු නොවේ. මෙමගින් (2) වරණය ඉවත් වේ. ඉතිරි වන්නේ (1) හා (3) ය. දැන් වේග අගයයන් දෙස බලන්න. A තන්තුවේ ස්පන්දවල වේගය $\sqrt{1/0.04} = \sqrt{100/4} = 5$ මෙයින් (3) වරණය ඉවත් වේ. මෙම ප්‍රශ්නයේ නොයෙක් කරුණු ගැන සැලකිල්ලට ගත යුතුව ඇත. A හා B තන්තු දෙක ස්පන්දවල යටිකුරු හා යටිකුරු නොවූ බව, වේගවල අගයයන් හා වමට දකුණට ගමන් කිරීම යන කරුණු 4 ක් ඇත. බහුවරණ ප්‍රශ්නයකට මෙතරම් කරුණු ප්‍රමාණයක් වැඩිබව දැනුනත් පෙර සඳහන් ආකාරයට එක කරුණක් ගැන පමණක් බලා වරණ ඉවත් කිරීමේ ක්‍රමය මෙහිදී යොදාගත යුතුය. සියල්ලම එකට බලන්නට ගියහොත් වැඩේ අමාරු වේ. සෑම වරණයකටම පාහේ යටිකුරු හා යටිකුරු නොවූ බවින් පටන් ගන්නා නිසා එතනින්ම වැඩේ පටන් ගන්න. එවිට සෑම වගන්තියකම සෑම දේ ගැනම සොයන්න ඕනෑ නැත. තන්තුවක තීර්යක් තරංගවල වේගය රඳා පවතින්නේ T හා m මත පමණි. පරාවර්තනය හෝ සම්ප්‍රේශණය වේගවලට බල නොපායි. නමුත් ස්පන්දවල විස්තාරය නම් අඩුවේ.

35. සරළ ප්‍රශ්නයකි. වායුවක (පරිපූර්ණ) ධ්වනි වේගය පීඩනය මත රඳා නොපවතී. උෂ්ණත්වය මත රඳා පවතී. මේවා පරීක්ෂා කර ඇත්තේ ජනප්‍රිය කී වෙනි වතාවටද? (A) හා (B) හරිය. (C) හි "තවත් වායුව" යන පද දෙක වෙනත් වායුවක් ලෙස සැලකුවොත් අපරාදේ වරදී. (C) වගන්තිය කියවන විට එකතු කරන්නේ වෙනත් වායුවක් යැයි සිතෙන්නට පුළුවන. "එම වායුවෙන් තවත් එකතු කළවිට" කියා ලියා තිබුනේ නම් හොඳ යැයි සිතේ. වෙනත් වායුවක් එකතු කලේ නම් සඵල අණුක ස්කන්ධ වෙනස් වන නිසා (C) නිවැරදි වේ. එම වායුවෙන්ම එකතු කළේ නම් පීඩනය වැඩිවේ. නමුත් ධ්වනි වේගයට එය බල නොපායි.

36. හැමදාම වාගේ දෙන සරල ප්‍රශ්නයකි. ප්‍රභවය නිශ්චලය. නිරීක්ෂකයා ප්‍රභවය දෙසට චලනය වේ.

$$\frac{340 + V}{340} \cdot 340 = 348 \qquad V = 8$$

340 දෙකක් ඇති නිසා සුළු කිරීම ඉතා පහසුය.

37. බැලූ බැල්මටම (C) නිවැරදි බව පෙනේ. (A) වැරදි බවද සොයා ගැනීමට එතරම් සිතිය යුතු නැත. මම මේ ප්‍රශ්නය කළා නම් අවස්ථා දෙකේ උෂ්ණත්ව ව්‍යාප්තිය කටු වැඩ කොලේ ඇඳ ගන්නෙමි. දැන් උත්තරය නිකමම පෙනේ. P හි තාප සන්නායකතාව වැඩි නිසා එම දණ්ඩේ උෂ්ණත්ව අනුක්‍රමණය Q ට වඩා අඩු විය යුතුය. (B) හා (C) සත්‍ය වේ.




38. $m_1$ දෙගුණ කළ විට M මත වම් අතට ක්‍රියාකරන බලය දෙගුණ වේ. M සමතුලිත කිරීමට නම් M මත දකුණු අතට ($m_2$ නිසා) ක්‍රියා කරන ගුරුත්වාකර්ශණ බලය ද දෙගුණ කළ යුතුය. එසේ වීමට නම් $m_2$ ස්කන්ධය M කරා ගෙන ආ යුතුය. $r_2$, 2a ට වඩා කුඩා එකම උත්තරය (2) පමණය. කොච්චර ෂෝක් ද ? හදන්න ඕනෑ නැත. හදනවානම් මෙහෙම හදන්න.

$$F \propto \frac{1}{(2a)^2} \propto \frac{1}{4a^2}$$

$$2F \propto \frac{1}{r^2}$$

ප්‍රකාශන බෙදූ විට $2 = \frac{4a^2}{r^2} \Longrightarrow r = \sqrt{2}\,a$




39. වම් පස හා දකුණු පස ධාරිත්‍රක එකිනෙකට සමාන්තර වේ.
දැන් මැද C වලින් වැඩක් නැත. වීස්ටන් ආකාරයේ පරිපථයක් සිහියට ගන්න.
දැන් C හා 2C ශ්‍රේණිගත වූ විට සමක ධාරිතාව 2/3 C වේ. (C ට වඩා අඩු විය යුතුය)
2/3 C දෙකක් සමාන්තරගතවූ විට සමකය 4/3 C හා C ශ්‍රේණිගත වූ විට 4/7 C වේ.
7/4 C විය නොහැක.



Scanned by CamScanner

40. යොදා ඇත්තේ ක'චොෆ් දෙවන නියමයයි. ප්‍රථමයෙන් වම් පැත්ත හදා ගන්න. කෝෂ අමුණා ඇති ආකාරයට සමග වි. ගා. බලය $E_1 + E_2 + E_3$ විය නොහැක. $E_2$ හා $E_3$ ඇත්තේ එකම අතටය. එමනිසා නිවැරදි වරණය විය යුත්තේ (3) හෝ (4) ය. දකුණු පැත්ත ඉතාම කිරි කජුය. $I(r_1+r_2+r_3)$ හැර වෙන මොනවද ? නිවැරදි වරණය (4) වේ.

41. මෙයත් ඉතාම ලේසිය. සෑම වගන්තියකම ඇත්තේ සාමාන්‍ය සරළ දැනුමය. (A) වගන්තිය නිවැරදිය. ධන හා සෘණ අග්‍ර ලකුණු කිරීමට පවා ප්‍රශ්ණයක් පසුගිය වසරේ ව්‍යුහගත රචනා ප්‍රශ්ණයේ ද අඩංගු විය. (B) වගන්තිය ද බහුවරණ, ව්‍යුහගත හා රචනා ප්‍රශ්ණවල නොයෙක් අවස්ථාවලදී පරීක්ෂා කර ඇත. එය වැරදිය. වෝල්ට්මීටරයේ අභ්‍යන්තර ප්‍රතිරෝධය R ට වඩා බොහෝ වැඩි විය යුතුය. (C) ද ඉතාම සරල වගන්තියකි. වෝල්ට්මීටරය තිබූ තැනම ඇමීටරය සම්බන්ධ කළහොත් පරිපථයේ ධාරාව R හා ඇමීටරය තුළින් ගමන් කරන නිසා දැන් ඇමීටරයේ පාඨාංකය අඩුවිය යුතුය. (C) නිවැරදිය.

42. O/L ගණනයකි. බල්බය නියමාකාරයෙන් දැල්වේ නම් එය තුළින් ගැලිය යුතු ධාරාව 2 A කි. (24/12 නිසා) 12 V , බල්බය හරහා ඇත්නම් ඉතිරි 12 V, R හරහා පැවතිය යුතුය. එනම්, $R = 6\,\Omega$ විය යුතුය. (12/2)

43. සරල ප්‍රකාශනයක් ලිවීම අවශ්‍යය. කම්බි දෙකේම හරස්කඩ වර්ගඵල සමාන නිසා $R = \rho l/A$ සම්බන්ධතාවයේ A ලිවීමට අවශ්‍ය නැත. (MCQ ප්‍රශ්ණයක් නිසා) ප්‍රතිරෝධ දෙක ශ්‍රේණිගතව සම්බන්ධ වේ. සඵල ප්‍රතිරෝධකතාව ρ නම්,

$\rho_1 l + \rho_2 2l = \rho 3l$ යන සමීකරණය ලියූ සැණින් ρ සඳහා ප්‍රකාශණය ලැබේ.

44. මෙහි වරණ අතුරින් (3), (4) හා (5) දකපු සැණින් ඒවා ඉවත් කළ හැක. ඒවා නිකම්ම නිකං බොල් උත්තර වේ. ඈතට ඈතට යන විට ප්‍රතිබිම්බවල තීව්‍රතා සමාන විය නොහැකි බව ඕනෑම කෙනෙකුට වැටහේ. තරඟය පවතින්නේ (1) හා (2) අතරය. $I_1$ සෑදෙන්නේ සාමාන්‍ය වීදුරු පෘෂ්ඨයෙන් ඇතිවන පරාවර්තනයෙනි. වාතයේ සිට ගමන් ගන්නා ආලෝක කිරණයක් සාමාන්‍ය වීදුරු කුට්ටියක මුහුණත මත වැටුණු විට පතනය වන ආලෝකයෙන් වැඩි කොටසක් වර්තනය වේ. සාමාන්‍යයෙන් 80% පමණ වර්තනය වන අතර ඉතිරි 20 % පරාවර්තනය වේ. මෙම අගයයන් නිශ්චිතව දැන සිටීම අවශ්‍ය නොවුවද සාමාන්‍ය දැනීමෙන් වර්තනය වන ප්‍රතිශතය වැඩි බව නොසිතුනොත් නිවැරදි උත්තරය ලෙස ගන්නේ (1) ය. නමුත් නිවැරදි උත්තර වන්නේ (2) ය. දෙවන පෘෂ්ඨයේ රිදී ආලේප කර ඇති නිසා පතන ශක්තිය මුලුමණින්ම පරාවර්තනය වේ. පහත පෙන්වා ඇති අන්දමට දළ තීව්‍රතා අගයයන් සංසන්දනය කළහොත් ඔබට මෙය පහසුවෙන් වැටහේවි.

$$.8\,I \times \frac{80}{100} = 0.64\,I$$

$$.64 > .2$$




45. මේ ආකාරයේ ගැටළු මෑත කාලයේ නොයෙක් ප්‍රශ්ණ පත්‍රවල ඇත. මෙහි බොහෝ විට වැරදුනොත් වරදින්නේ (A) වගන්තියයි. $S_1$ පෘෂ්ඨය තුළ සඵල ආරෝපණය ශුන්‍යය. $(-4 + 2 + 2)$ එමනිසා $S_1$ පෘෂ්ඨය හරහා සඵල ස්‍රාවය ශුන්‍ය බව ඇත්තය. නමුත් එමගින් පෘෂ්ඨය හරහා විද්‍යුත් බල රේඛා ගමන් නොකරන බව ගම්‍ය නොවේ. ඇත්තටම ඇතුළත ඇති ධන ආරෝපණ නිසා බල රේඛා $S_1$ පෘෂ්ඨයෙන් ඉවතට යයි. සෘණ ආරෝපණ නිසා විද්‍යුත් බල රේඛා $S_1$ පෘෂ්ඨය තුළට යයි. නමුත් ඇතුළත සඵල ආරෝපණය ශුන්‍ය නිසා පිටතට යන බල රේඛා ගණනට සමාන බල රේඛා ගණනක් ඇතුළට පැමිණේ. එමනිසා සඵල ස්‍රාවය ශුන්‍ය වේ. පිටතින් ඇති ($S_1$ ට) ආරෝපණ නිසා ද $S_1$ පෘෂ්ඨය හරහා බල රේඛා ගමන් කරයි. නමුත් ඇතුළුවන බල රේඛා සියල්ලම නැවත පිටවේ. එමනිසා (A) වැරදිය. 60 න් 59 නිවැරදි වූ ශිෂ්‍යයෙකුගේ වැරදුණු ප්‍රශ්ණය මෙය වූ බව අසන්නට ලැබුණි. (B) හා (C) නිවැරදි බව සක්සුදක් සේ පැහැදිලිය. ඕනෑම ආරෝපණයක් නිසා ඇතිවන ස්‍රාවය රඳා පවතින්නේ එම ආරෝපණය මත පමණි. $S_2$ පෘෂ්ඨය තුළ පවතින සඵල ආරෝපණය ශුන්‍ය නොවේ. එය -1 q වේ. එමනිසා (C) නිවැරදිය. $S_2$ පෘෂ්ඨය හරහා සඵල ස්‍රාවය පෘෂ්ඨය තුළට වේ.



Scanned by CamScanner

46.මෙයට ගතානුගතික ලෙස සමීකරණ ලිවීම අවශ්‍ය නැත. ඝනකවල හරස්කඩ වර්ගඵලයන් සමාන නිසා වැඩේ ඉතා ලේසිය. දෙකම ඇත්තේ එකම ද්‍රව්‍යේය. (ජලයේ) A හි ස්කන්ධය $m_1$ ලෙස ද, B හි ස්කන්ධය $m_2$ ලෙසද ගනිමු.

$$m_1 \propto {}^1/_2 \qquad m_1 \propto {}^3/_4$$

එමනිසා $m_1 + m_2 \propto {}^1/_2 + {}^3/_4 \propto 1\,{}^1/_4$

එමනිසා A සම්පූර්ණයෙන් ගිලේ. B හි 1/4 ජලය තුළ පවතී.

47.පොඩි ගණනයක් අවශ්‍යය. අංශු දෙක හමුවන විට P ගමන් කළ කාලය t නම් Q එම අවස්ථාව වන තෙක් ගමන් කළ කාලය t - 1 වේ.

$4t = 5(t - 1) \qquad t = 5 \quad (4 \times 5 = 5 \times 4)$

හමුවන දුර 20 m

48.ධ්වනි තීව්‍රතාවය $\propto {}^1/_{r^2}$ මෙය සාමාන්‍ය දැනුම වුවද විෂය නිර්දේශයේ නැති බැවින් එය ප්‍රශ්නයේ සඳහන් කර ඇත. 10 m දුරකදී තීව්‍රතාව 1 m ක තීව්‍රතාවයෙන් ${}^1/_{100}$ කි. තීව්‍රතාවය 100 ගුණයකින් අඩුවේ නම් ඊට අනුරූපව තීව්‍රතා මට්ටමේ වෙනස (අඩුවීම) 20 dB කි. එබැවින් 100 m දී තීව්‍රතා මට්ටම 30 dB කි. (50 - 20)

සමීකරණ යොදා හදනවානම්,

$\beta_2 - \beta_1 = 10 \log I_2/I_1 \qquad I_2 = 10^{-2} I_1$

$\beta_2 - 50 = -20 \Longrightarrow \beta_2 = 30$

49.ක්‍රම දෙකකට විසඳිය හැක. එක් ක්‍රමයක් වන්නේ X සඳහා A, B, C ඇසුරෙන් බූලීය ප්‍රකාශණය ලියා එක් එක් අවස්ථාවන් සළකා බැලීමය.

$X = \overline{AB} + \overline{BC}$

| | | | | |
|---|---|---|---|---|
| $t_0 - t_1$ | $A = B = C = 0$ | $\overline{AB} = 1$ | $\overline{BC} = 1$ | $X = 1$ |
| $t_1 - t_2$ | $A = B = C = 1$ | $\overline{AB} = 0$ | $\overline{BC} = 0$ | $X = 0$ |
| $t_2 - t_3$ | $A = 0, B = 1, C = 0$ | $\overline{AB} = 1$ | $\overline{BC} = 1$ | $X = 1$ |

දිගට ලියූවට මේවා දන්න දරුවෙකුට ලිවීමට අවශ්‍ය වන්නේ $X = \overline{AB} + \overline{BC}$ පමණය. අනෙක් ක්‍රමය නම් අවස්ථා තුනේ A, B, C අගයයන් සමග පරිපථය හරහා මනස තුළින් ගොස් අවසන් ප්‍රතිඵලය පමණක් කටුවැඩ කොළයේ හෝ ප්‍රශ්න පත්‍රයේ ලියා ගැනීමයි.

0, 0 යි 1 යි    0 0 යි 1 යි    1 යි 1 යි 1 යි
1, 1 යි 0 යි    1 1 යි 0 යි    0 යි 0 යි 0 යි
0, 1 යි 1 යි    1 0 යි 1 යි    1 යි 1 යි 1 යි

මෙහි ඇත්තේ මනසෙන් කියවන ආකාරයයි.

50.මෙය අනපවර්තන කාරකාත්මක වර්ධකයකි. ප්‍රථමයෙන් සාමාන්‍ය විධියට වෝල්ටීයතා ලාභය සෙවුවහොත් එය ${}^{(10+1)}/_1 = 11$ වේ. මේ අනුව $V_{out} = 22$ V විය යුතුය. වක් ගාලා (1) පාට කරනවා නියතය. පොඩ්ඩක් ඉන්න. $V_{out}$ සැපයුම් වෝල්ටීයතාව වන 10 V ට වඩා වැඩි නොහැක. එසේ වුවහොත් ශක්තිය මැවිය හැක. එමනිසා නිවැරදි උත්තරය වන්නේ (4) ය. අනෙක් අතට 2 V ගණනක වෝල්ටීයතාවක් වර්ධනය කිරීමට කාරකාත්මක වර්ධක සාමාන්‍යයෙන් භාවිතා කිරීමේ තේරුමක් නැත. මෙවැනි වර්ධක පරිපථවල ප්‍රදානය $\mu$V, mV ප්‍රමාණයේ පවතී. $V_{out}$ ආසන්න වශයෙන් අසන්නේ සත්‍ය වශයෙන්ම එය 10 V ට වඩා මදක් අඩුවන නිසාය.

51.කෝෂයේ වි.ගා. බලය 10 V නිසා සාමාන්‍යයෙන් 10 V, 25 $\Omega$, R හා 50 $\Omega$ අතර බෙදී යා යුතුය. නමුත් 50 $\Omega$ හරහා සෙනර් දියෝඩයක් පසු නැඹුරු ආකාරයෙන් සම්බන්ධ කොට ඇති නිසා 50 $\Omega$ හරහා විභව අන්තරය 5 V හි ම පවතී. සෙනර් දියෝඩයක් භාවිත කිරීමේ කාර්ය භාරය වන්නේ ද මෙයමය. R = 25 $\Omega$ වන විට කෝෂයේ ඉතිරි 5 V, (25 + 25) අතර බඩී.



Scanned by CamScanner

එවිට $I = 0.1(^5/_{50})$ වේ. $R = 0$ වන විට ඉතිරිය වන 5 V මුලු මතින්ම 25 Ω හරහා පවතී. එවිට $I = 0.2$ වේ. $(^5/_{25})$ තවු වැඩ අවශ්‍ය නැත. මනෝමයෙන් සෑදිය හැක.

52. මෙය ඉතා සුලබ ප්‍රසිද්ධ ප්‍රශ්නයකි. සම්බන්ධ කිරීමෙන් පසු කුඩා ගෝලයේ ආරෝපණය $q^1$ නම් අනෙකේ තිබිය යුතු ආරෝපණය $2q - q^1$ වේ. (ආරෝපණ සංස්ථිතිය) සම්බන්ධ කළ පසු ගෝලවල විභව සමාන විය යුතු නිසා,

$$\frac{q^1}{r} = \frac{2q - q^1}{2r} \quad 2q^1 = 2q - q^1 \Rightarrow q^1 = \frac{2}{3}q$$

53. කම්බි දෙකේ ධාරා ගලන්නේ එකම දිශාවටය. එම නිසා කම්බිවල හරිමැද අභිශූන්‍ය $(B = 0)$ ලක්ෂ්‍යයක් පිහිටිය යුතුය. අනෙක් තැන්වලදී $B \propto {}^1/_r$ විය යුතුය. මේ කරුණු දෙකම තෘප්ත කරන්නේ (2) ප්‍රස්තාරය පමණි. $B = 0$ වන ලක්ෂ්‍යයක් තිබිය යුතු තර්කයෙන්ම (3), (4) හා (5) ඉවත් කළ හැක. B සරල රේඛීයව විචලනය විය නොහැක. එයින් (1) ඉවත් වේ.

54. බැලූ බැල්මට අමාරු ප්‍රශ්නයක් වුවත් එතරම් බැරෑරුම් නැත. ද්‍රවයේ ඝනත්වය දී නොමැති නිසා උඩුකුරු තෙරපුම ගණන් ගැනීමට අවශ්‍ය නැත. ආන්ත වේග එකවිටම ගණනය කළහැක. ගෝල දෙක අතර පරතරයේ වැඩිවීමේ හෝ අඩුවීමේ ශීඝ්‍රතාවය වන්නේ ආන්ත වේග වෙනසයි. වේගය යනු තත්පරයකට (ඒකක කාලයකට) ගමන් කරන දුරයි. එම නිසා ගෝල අතර පරතරය වෙනස් වීමේ ශීඝ්‍රතාව $V_1 - V_2$ ය. $m_1$ ගෝලයේ ආන්ත වේගය වැඩිය ($m_1 > m_2$ නිසා, අරයයන් සමානය) රූපයේ $m_1$ ඇඳ ඇත්තේ $m_2$ ට ඉහළින්ය. මෙයින් ගම්‍ය වන්නේ $m_2$, $m_1$ ට පෙර මුදා හැර ඇති බවයි. එක විට මුදා හැරියේ නම් $m_1$, $m_2$ ට පහලින් ගමන් කළ යුතුය. $m_1$, $m_2$ ට ඉහළින් ඇති නිසාත් $m_1$ හි වේගය $m_2$ හි වේගයට වඩා වැඩි නිසාත් ඒවා අතර පරතරය අඩුවෙමින් පැවතිය යුතුය. නිවැරදි උත්තරය (5) වේ.
$m_1 g = 6\pi\eta a V_1$

55. වායුගෝලීය උෂ්ණත්වය හා තුෂාරාංකය 5 වන දිනදී එක සමාන වී ඇත. වායුගෝලීය උෂ්ණත්වය හා තුෂාරාංකය සමාන නම් වායුගෝලීය සාපේක්ෂ ආර්ද්‍රතාව 100 % වේ. අනෙක් සෑම දිනකදීම වායුගෝලීය උෂ්ණත්වය අදාල තුෂාරාංකය ට වඩා වැඩිය. එම නිසා 5 වන දිනදී හැර අනෙක් සෑම දිනකදී සාපේක්ෂ ආර්ද්‍රතාව 100 % ට වඩා අඩුය. එබැවින් (A) වැරදිය. (B) හරිය. 6 වැනි දිනදී වායුගෝලීය උෂ්ණත්වය 8 වන දිනට වඩා තුෂාරාංකයට සමීපය. 5 වන දිනදී මීදුම ඇති විය හැක. එබැවින් නිවැරදි වන්නේ (B) පමණය.

56. සාමාන්‍ය තාප හුවමාරු සම්බන්ධතාව ලිවිය යුතුය. සාමාන්‍යයෙන් මෙවැනි ප්‍රකාශන ලියන විට පරිසරයට තාප හානියක් හෝ පරිසරයෙන් තාප අවශෝෂණයක් සිදු නොවන බව උපකල්පනය කරණු ලැබේ. අවශෝෂණය කරන තාප ප්‍රමාණය h නම්,

$$m_w s_w 20 + h = m_l L + m_l s_w 10$$

නිවැරදි ප්‍රකාශනය (2) බව පැහැදිලි වේ. h ප්‍රකාශනයේ හරි පැත්තට ලියාගත යුතුය. මෙය පරිස්සෙමින් කළ යුතුය. ජලයෙන් තාපය ඉවත්වේ. අයිස් හා ජලය බවට පත්වූ ($^0$C ඇති) අයිස් තාපය අවශෝෂණය කරයි. එම නිසා ඉහත ප්‍රකාශනයේ දකුණු පැත්තට h එකතු කිරීමට පෙළඹවීම බොහෝ විට සිදුවේ. එය තර්කානුකූල යැයිද සිතේ. `මන්දයත් අවශෝෂණය වන තාපය ලියා ඇත්තේ දකුණු පස නිසාය. මෙහි ඇති රහස කුමක්ද ? මිශ්‍රණයේ අවසාන උෂ්ණත්වය මැන ඇත්තේ පරිසරයෙන් වන තාප අවශෝෂණයක් ඇතුලත්වය. මෙය සිදු නොවූයේ නම් මිශ්‍රනයේ අවසාන උෂ්ණත්වය 10 $^0$C ව වඩා අඩු විය යුතුව තිබුණි. 10 $^0$C ලැබී ඇත්තේ මෙම තාපයත් ඇතුලත්වය එම නිසා ඉහත සමානතාව ලියන විට h දකුණු පසෙන් ඉවත් කළ (අඩු කළ) යුතුය. නැතිනම් වම් පසට එකතු කළ යුතුය. ප්‍රශ්නය පහසු වුවත් (2) වෙනුවට (5) ලකුණු කිරීම බොහෝ විට සිදුවිය හැක.

57. ස්කන්ධ දෙකේ චලිතයන් සඳහා සමීකරණ දෙකක් ලිවිය යුතුය. අසන්නේ, $T_2$ හා $T_1$ අතර සම්බන්ධය නිසාත් ස්කන්ධ හා කෝණික වේග සමාන නිසාත් m, ω, R යන සංකේත බොරුවට ලිවීමේ තේරුමක් නැත. B හි ස්කන්ධය සඳහා,



Scanned by CamScanner

$$T_2 - T_1 \propto 1 \qquad (T_2 - T_1 = mR\omega^2)$$

C හි ස්කන්ධය සඳහා $T_1 \propto 2 \qquad (T_1 = m2R\omega^2)$

$$\frac{T_2 - T_1}{T_1} = \frac{1}{2}$$

දෙපසට ලවයට හරය එකතු කළවිට.

$$\frac{T_2}{T_1} = \frac{3}{2} \Rightarrow T_2 = \frac{3}{2} T_1$$

58. පෘථිවි චුම්බක ක්ෂේත්‍රය හෝ වෙනත් චුම්බක ක්ෂේත්‍රයක් නොතිබුනේ නම් I ධාරාව නිසා ඇතිවන චුම්බක ක්ෂේත්‍රයේ දිශාව කඩ ඉරි සහිතව ඇඳ ඇති වෘත්තයේ ස්පර්ශක දිශාවලට පිහිටයි. තිරස් තලයේ තවත් චුම්බක ක්ෂේත්‍රයක් ඇත් නම් මාලිමාව එල්ල වන්නේ සම්ප්‍රයුක්ත චුම්බක ක්ෂේත්‍රයේ දිශාවටය. I ධාරාවෙන් ඇතිවන චුම්බක ක්ෂේත්‍රය වෘත්තයේ ස්පර්ශක දිශාවට ඇති නිසා යම් ස්ථානයකදී මාලිමාව ස්පර්ශකයේ දිශාවටම යොමු වී ඇත්නම් අනෙක් චුම්බක ක්ෂේත්‍රයත් එම දිශාවටම පිහිටිය යුතුය. එසේ ඇඳ ඇත්තේ $P_3$ පිහිටුමේ පමණි.

අනෙක සෑම පිහිටුමකදීම මාලිමාව යොමුවී ඇත්තේ ස්පර්ශකවල දිශාවට ආනතවය. උදාහරණයක් වශයෙන් $P_1$ පිහිටුමේදී ධාරාවෙන් ඇතිවන චුම්බක ක්ෂේත්‍රය (B) හා පෘථිවි චුම්බක ක්ෂේත්‍රයේ තිරස් සංරචකය (H) හා සම්ප්‍රයුක්තයේ දි ශ ා ව රූපයේ පෙන්වා ඇත.




59. (a) අවස්ථාවේ දණ්ඩ එහි බර නිසා පහළට සම්පීඩනය වේ.

(b) අවස්ථාවේ දී දණ්ඩ එහි බර නිසා ඇදේ. (a) අවස්ථාවේ දණ්ඩේ පහළට එත්ම සලකුණු අතර පරතරය සම්පීඩනය නිසා අඩුවේ. එනම් $\Delta l$ සෘණ අගයන් ගන්නා අතර එහි අගය ක්‍රමයෙන් සෘණව වැඩිවේ. Y පහළ කෙළවර වැඩියෙන්ම සම්පීඩනය වේ. (b) අවස්ථාවේදී X කෙළවර වැඩියෙන්ම ඇදෙන අතර සළකුණු අතර පරතරය සම්මත මිලි මීටරයකට වඩා වැඩිවේ. එනම් $\Delta l$ ධන අගයක් ගන්නා අතර Y කෙළවරට පැමිණෙත්ම ඇදෙන ප්‍රමාණය අඩුවන නිසා $\Delta l$ ක්‍රමයෙන් අඩුවේ. $\Delta l$ සෘණ අගයයන් ගන්නා එකම එක ප්‍රස්ථාරය (4) වන නිසා එච්චර නොසිතාම නිවැරදි උත්තරය එය බව තීරණය කළ හැක. මෙම ප්‍රශ්ණයේ භෞතික විද්‍යාවට වඩා ඇත්තේ සාමාන්‍ය දනීමයි. (a) අවස්ථාවේදී දණ්ඩ පහළට සම්පීඩනය වන බවත්, (b) අවස්ථාවේදී දණ්ඩ ඉහළට ඇදෙන බවත් තීරණය කළේ නම් නිකම් ම උත්තරය ලැබේ. බර රබර් සිලින්ඩරාකාර පොලු දෙකක් ගැන සිතුවේ නම් සිදුවන දෙය මනසේ ඇදේ.

60. ගුරුත්වජ ත්වරණය යටතේ වැටෙන පුඩුව චුම්බක ක්ෂේත්‍රය තුලට ඇතුලුවීමේදී පුඩුව තුළ ප්‍රේරණය වන වි. ගා. බලය නිසා ගලන ධාරාවෙන් පහළ තිරස් බාහුව මත උඩු අතට බලයක් යෙදේ. (i / B) මේ බව නොයෙක් අවස්ථාවලදී පරීක්ෂා කර ඇත. මෙම උඩු අතට ඇතිවන බලය නිසා පුඩුවේ ත්වරණය අඩුවේ. සම්පූර්ණයෙන්ම ක්ෂේත්‍රය තුළට පැමිණි පසු පුඩුවේ ප්‍රේරිත වි. ගා. බලය ශුන්‍ය වන නිසා i / B ශුන්‍ය වේ. එවිට නැවතත් පුඩුව ගුරුත්වජ ත්වරණය යටතේ වැටේ. නැවත පුඩුව ක්ෂේත්‍රයෙන් ඉවත් වන විට මේ ක්‍රියාවලිය නැවත සිදුවේ. ඊළඟට පුඩුව ක්ෂේත්‍රයක් නොමැති පෙදෙසක වැටෙන නිසා නැවතත් ත්වරණය g වේ. ආයෙත් දෙවන ක්ෂේත්‍ර පෙදෙසට පුඩුව ඇතුළුවන විට පෙර සිදුවූ දේ නැවත සිදුවේ. එබැවින් 4 වතාවක් පුඩුවේ ත්වරණය g වලට වඩා අඩුවේ.





Scanned by CamScanner

v-t ප්‍රස්ථාර (1) හා (4) අතරින් එකක් බව පැහැදිලිව පෙනේ. මෙම ප්‍රස්ථාර දෙක අතර ඇති වෙනස කුමක් ද ? (1) ප්‍රස්ථාරයේ අඩු ත්වරණය පෙන්නුම් කරන පෙදෙස වක්‍රාකාර වන අතර (4) හි එය සරල රේඛීය වේ. මේ වෙනස පෙනීමට ටිකක් උකුසු ඇසක් තිබිය යුතුය. බොහෝ දරුවන් (4) ප්‍රස්ථාරය තෝරාගන්නවාට සැකයක් නැත. පුඩුව සිරස්ව වැටෙන නිසා මෙහිදී තව කරුණක් ගැන සැලකිය යුතුය. පුඩුවේ වේගය (v) පහළට වැටෙන විට නියත නොවේ. එය වැඩිවේ. එමනිසා පුඩුව තුළ ප්‍රේරණය වන වි. ගා. බලය v l B නියත නොවේ. පුඩුව ක්ෂේත්‍රය තුළට හා එයින් පිටතට යන විට ප්‍රේරිත වි. ගා. බලය නියත නොවන (වැඩිවන) නිසා පුඩුව තුළ ගලන ධාරාවද ස්වල්ප වශයෙන් වැඩිවේ. එබැවින් F = i l B බලය ද ස්වල්ප ව වැඩිවේ. මෙයින් නිගමනය කළ හැක්කේ පුඩුව ක්ෂේත්‍රය තුළට හා එයින් පිටතට යන විට පුඩුවේ ත්වරණය ඒකාකාර නොවන බවයි. එමනිසා අදාල v-t ප්‍රස්ථාරය සරල රේඛාවක් විය නොහැක. එහි හැඩය  මේ ආකාරයෙන් විය යුතුය.
(ක්‍රමයෙන් අඩුවන ත්වරණයක්)
එබැවින් නිවැරදි හැඩය (1) ප්‍රස්ථාරය වේ. (4) ප්‍රස්ථාරය ලැබිය හැකි අවස්ථාව ඔබට සිතිය හැකි ද?

### කටු වැඩ කොළය

07. $\frac{1000}{250}$

08. $2.1 \times 10^9 = m \times 9 \times 10^{16}$

21. $2 \times 10^{-5} = {}^1/n$

28. $\frac{240 \times 240}{60} \times 6 \times \frac{5}{1000 \times 60}$

32. $\frac{1}{10} - \frac{1}{8} = \frac{1}{f}$

33. $\frac{Mg}{m} = f\ \frac{L}{2}$

36. $\frac{(340 + V)\ 340}{340} = 348$

37.



43. $\rho_1 l + \rho_2 2l = \rho\ 3l$

46. $m_1 \propto {}^1/_2 \quad m_2 \propto {}^3/_4$

$m_1 + m_2 \propto 1\,{}^1/_4$

47. $4t = 5(t - 1)$

49.

| | | |
|---|---|---|
| 001 | 001 | 111 |
| 110 | 110 | 000 |
| 011 | 101 | 111 |

52. $\frac{q^1}{r} = \frac{2q - q^1}{2r}$

56. $m_w s_w 20 + h = m_i L + m_i s_w 10$

57. $T_2 - T_1 = 1$

Scanned by CamScanner

## A කොටස - ව්‍යුහගත රචනා

ප්‍රශ්න හතරට ම පිළිතුරු මෙම පත්‍රයේ ම සපයන්න.

($g = 10\ N\ kg^{-1}$)




1 රූපය

(*a*) 1 රූපයෙහි පෙන්වා ඇති මයික්‍රෝමීටර ඉස්කුරුප්පු ආමානයෙහි *A*, *B*, *C* සහ *D* ලෙස සලකුණු කරන ලද කොටස් නම් කරන්න.

(i) *A* ප්‍රධාන/රේඛීය පරිමාණය (විල්ල) ............ (ii) *B* වෘත්තාකාර/දිදාල පරිමාණය ............

(iii) *C* දිදාලය ............ (iv) *D* දිදාල හිස / රැචට්ටය ............

(*b*) (i) ඉහත මයික්‍රෝමීටර ඉස්කුරුප්පු ආමානයෙහි කුඩා ම මිනුම mm වලින් කුමක් ද?

............0.01 mm.

(ii) ඉහත 1 රූපයෙහි පෙන්වා ඇති බෝලයේ විෂ්කම්භය සඳහා පරිමාණයේ පාඨාංකය mm වලින් ලියන්න. ............6.48 mm.

(iii) මූලාංක දෝෂය සොයාගැනීම සඳහා මයික්‍රෝමීටර ඉස්කුරුප්පු ආමානය සකසා ඇති අවස්ථාවක් 2 රූපයෙහි පෙන්වා ඇත.




2 රූපය

බෝලයේ විෂ්කම්භය සඳහා නිවැරදි අගය mm වලින් දක්වන්න. ............6.51 mm

(iv) බෝලයෙහි විෂ්කම්භය සඳහා මිනුමෙහි භාගික දෝෂය ලියා දක්වන්න. (සංඛ්‍යාත්මක සුළුකිරීම අවශ්‍ය නොවේ.)

0.01 / 6.51 හෝ 0.005 / 6.51 ............

(v) වස්තුව පමණට වඩා තෙරපීම වැළැක්වීම සඳහා මයික්‍රෝමීටර ඉස්කුරුප්පු ආමානයේ යොදා ඇති පූර්වෝපාය කුමක් ද?

පාඨාංකයක් ගැනීමේදී දිදාල හිසෙන් අල්ලා කරකවන විට එය නිදැල්ලේ කැරකේ / ............

දිදාල හිසෙන් ක්ලික් ශබ්දයක් ඇසී තෙරපීම නතර වේ. ............



Scanned by CamScanner

(c) 3 රූපයෙහි පෙන්වා ඇති පරිදි වෘත්තාකාර හරස්කඩක් සහිත කම්බියක් (දිග $l$ = 55 cm සහ විෂ්කම්භය $d_1$ = 4 mm) තැටියකට (විෂ්කම්භය $d_2$ = 5 cm සහ ඝනකම $t$ = 3 mm) සවිකර ඇත. වරහන් තුළ දී ඇති විශාලත්ව, ආසන්න අගයයන් වේ.




3 රූපය

(i) ඉහත එක් එක් රාශිය මැනීම සඳහා මීටර රූල, ගෝලමානය, වර්නියර් කැලිපරය සහ මයික්‍රොමීටර ඉස්කුරුප්පු ආමානය යන මිනුම් උපකරණ අතරෙන් වඩාත් ම සුදුසු උපකරණය ලියා දක්වන්න.

| මිනුම | උපකරණය |
|---|---|
| $l$ | මීටර් රූල |
| $d_1$ | මයික්‍රෝමීටර ඉස්කුරුප්පු ආමානය |
| $d_2$ | වර්නියර් කැලිපරය |
| $t$ | මයික්‍රෝමීටර් ඉස්කුරුප්පු ආමානය |

(ii) තැටියෙහි ඝනකම සඳහා වඩා හොඳ අගයක් ලබාගැනීමට ඔබ අනුගමනය කරන පරීක්ෂණාත්මක ක්‍රියා පිළිවෙළ කුමක් ද?

ස්ථාන කිහිපයකින් මිනුම් කිහිපයක් ගෙන සාමාන්‍ය ලබා ගන්න.

(d) එක්තරා වර්ගයක පොලිතීන් කොළයක (polythene sheet) ඝනකම මයික්‍රොමීටර ඉස්කුරුප්පු ආමානයේ කුඩා ම මිනුමට වඩා බෙහෙවින් කුඩා වේ. මයික්‍රොමීටර ඉස්කුරුප්පු ආමානය භාවිතයෙන් කොළයක ඝනකම නිමානය කිරීම සඳහා ක්‍රමයක් යෝජනා කරන්න.

ඝනකම කුඩාම මිනුමට වඩා වැඩිවන පරිදි කොළ විශාල ප්‍රමාණයක් භාවිතා කරන්න.

ඝනකම කුඩාම මිනුමට වඩා විශාල වන පරිදි කොළයක් සෑහෙන වතාවක් නවන්න.




230 V, 25 W සූත්‍රිකා බල්බයකින් තාපය ලෙස උත්සර්ජනය වන විද්‍යුත් ක්ෂමතාව පරීක්ෂණාත්මක ව සෙවීම සඳහා ඔබට දී ඇති උපකරණයන්ගෙන් සමහරක් රූපයේ පෙන්වා ඇත. බල්බය මගින් පිට කරනු ලබන තාපය එකතු කර ගැනීම සඳහා ජලය භාවිත කළ යුතු බව ඔබට කියා ඇත.

(a) (i) මෙම පරීක්ෂණය කිරීමට ඔබ භාවිත කරන පරීක්ෂණාත්මක ඇටවුම පෙන්වීම සඳහා, අවශ්‍ය උපකරණ ඇතුළත් කොට ඉහත රූප සටහන සම්පූර්ණ කරන්න. අයිතම නම් කරන්න.

(ii) ඔබ කුමන මට්ටම දක්වා ජලය පුරවන්නේ දැයි රූප සටහනෙහි ලකුණු කර පෙන්වන්න.
(ජල මට්ටම PQ සහ RS රේඛා අතර පිහිටිය යුතුයි.)



Scanned by CamScanner

(b) මෙම පරීක්ෂණයේ දී කුඩා බීකරයක් භාවිත කිරීම වාසිදායක වන්නේ ඇයි දැයි දැක්වීමට හේතු දෙකක් දෙන්න.

(1) සැලකිය යුතු උෂ්ණත්ව වැඩිවීමක් ලබාගත හැක. / බීකරය අවශෝෂණය කරන්නාවූ තාපය කුඩාය.

(2) ජල පෘෂ්ඨයෙන් (වටපිටාවට) සිදුවන තාප හානිය අවම වේ. / උෂ්ණත්ව වැඩිවීම සඳහා ගතවන කාලය අඩු නිසා පරිසරයට වන තාප හානිය අඩුය.

(c) මෙම පරීක්ෂණයේ දී මිනුම් ගැනීම සඳහා අවශ්‍ය උපකරණවල ලැයිස්තුවක් දෙන්න.

උෂ්ණත්වමානය, විරාම ඝටිකාව හා තුලාවක්

(d) 230 V, 25 W සූත්‍රිකා බල්බයක් උපයෝගී කර ගනිමින් මෙම පරීක්ෂණය කළ විට මිනිත්තු 10 ක් තුළ දී ජලයේ උෂ්ණත්වය 28 °C සිට 37 °C දක්වා වැඩි වූ බව සොයා ගන්නා ලදී. භාවිත කළ ජලයේ ස්කන්ධය 240 g විය. තාපය ලෙස ජලයට සංක්‍රාමණය වූ විද්‍යුත් ක්ෂමතාව නිමානය කරන්න. (ජලයේ විශිෂ්ට තාප ධාරිතාව $= 4200\ J\ kg^{-1}\ K^{-1}$.)

ජලය උරාගන්නා තාපය $= 240 \times 10^{-3} \times 4200 \times 9$

ජලයට සංක්‍රමණය වන විද්‍යුත් ක්ෂමතාවය $= \dfrac{240 \times 10^{-3} \times 4200 \times 9}{10 \times 60}$

$= 15.12\ W$ (15.0 - 15.2 W)

(e) ඉහත (d) හි ලබා ගත් අගය, බල්බයෙන් තාපය ලෙස උත්සර්ජනය වූ ක්ෂමතාවයේ නියම අගයට සමාන නොවීමට ඉඩ ඇත. මෙම පරීක්ෂණයේ දී සැලකිල්ලට නොගැනුන, තාපය හානි විය හැකි විධි දෙකක් දෙන්න.

(1) බීකරයෙන් අවශෝෂණය කරන්නාවූ තාපය / පරිසරයට වන තාප හානිය

(2) බල්බය හා හෝල්ඩරය අවශෝෂණය කරන තාපය (හෝ සංවහනය විකිරණය, වාෂ්පීභවනය)

(f) සමහර නිෂ්පාදකයෝ විදුලි ලාම්පු ආවරණ (lamp shade) සඳහා උපරිම ක්ෂමතා ප්‍රමාණනයක් දක්වති. මෙයට හේතුව කෙටියෙන් පැහැදිලි කරන්න.

ලාම්පු ආවරණයට හානි සිදුවිය හැක. / පිළිස්සී යා හැක. / පමණට වඩා රත් විය හැක.




1 රූපය

L නම් උත්තල කාචයක නාභීය දුර නිර්ණය කිරීම සඳහා ශිෂ්‍යයකු විසින් භාවිත කරන ලද, නිවැරදි ව සකස් කළ පරීක්ෂණාත්මක ඇටවුමක දළ සටහනක් 1 රූපයෙහි දක්වේ.

මෙම පරීක්ෂණයේ දී X අල්පෙනෙත්තෙහි තාත්ත්වික ප්‍රතිබිම්බයේ පිහිටීම Y අල්පෙනෙත්ත ආධාරයෙන් සොයා ගනු ලැබේ.

(a) S තඩකිරය තිබීමේ වාසිය කුමක් ද?

අනෙකුත් වස්තූන්ගෙන් දර්ශන පථයට ඇති බාධා වළක්වා ගැනීමට

X හි ප්‍රතිබිම්බය හා Y පමණක් බලා ගැනීමට / X හි ප්‍රතිබිම්බය පැහැදිලිව බලා ගැනීම සඳහා



Scanned by CamScanner

(b) (i) 2 රූපයෙහි දක්වෙනුයේ $X$ හි තාත්ත්වික ප්‍රතිබිම්බය නිරීක්ෂණය කිරීම සඳහා ශිෂ්‍යයා කාචයේ ප්‍රධාන අක්ෂය මත පිහිටි $E$ ලක්ෂ්‍යයේ ඇස තැබූ විට ඔහුට පෙනෙන ($Y$ අල්පෙනෙත්ත සහිත) දර්ශන පථයයි. (මෙහි $X$ හි ප්‍රතිබිම්බය පෙන්වා නොමැත.)



2 රූපය

2 රූපය මත $X$ හි ප්‍රතිබිම්බය අඳින්න.

(ii) ශිෂ්‍යයා ඔහුගේ ඇස පාර්ශ්වික ව චලනය කරමින් $X$ හි ප්‍රතිබිම්බයේ සහ $Y$ හි චලන නිරීක්ෂණය කළහොත්

(I) $X$ හි ප්‍රතිබිම්බය, $Y$ හි පිහිටීමේ යැදී නොමැති විට ඔහුට පෙනෙනුයේ කුමක් ද?

X හි ප්‍රතිබිම්බය හා Y අතර සාපේක්ෂ චලිතයක් ඇත. වෙන් වෙන්ව චලනය වේ.

(II) $X$ හි ප්‍රතිබිම්බය, $Y$ හි පිහිටීමේ යැදී ඇතිවිට ඔහුට පෙනෙනුයේ කුමක් ද?

X හි ප්‍රතිබිම්බය හා Y එකට චලනය වේ. සාපේක්ෂ චලිතයක් නොමැත.

(c) මෙම පරීක්ෂණය සඳහා වස්තු දුර $U$, ප්‍රතිබිම්බ දුර $V$, සහ කාචයේ නාභිය දුර $f$ අතර සම්බන්ධතාව, කාච සූත්‍රයට ලකුණු සම්මුතිය යෙදීමෙන් පසුව ලියා දක්වන්න.

$\frac{1}{V} + \frac{1}{U} = \frac{1}{f}$

(d)




ශිෂ්‍යයා, $U$ සහ $V$ සෙන්ටිමීටර මගින් සටහන් කර, කාචයේ නාභිය දුර සෙවීම සඳහා නියමාකාරයෙන් අක්ෂ තෝරාගෙන, පෙන්වා ඇති ප්‍රස්තාරය ඇන්දේ ය. ඔහු ප්‍රස්තාරය ඇඳීම සඳහා සෙන්ටිමීටර මගින් සටහන් කළ අගයයන් භාවිත කළ බව සලකන්න.

(i) ප්‍රස්තාරයේ අක්ෂ නම් කරන්න.

(ii) $L$ කාචයෙහි නාභිය දුර නිර්ණය කරන්න.

$0.1 = \frac{1}{f}$  $f = 10$ cm (9.8 cm - 10.2 cm)

(e) $X$ හි එක්තරා පිහිටීමක් සඳහා ශිෂ්‍යයා විසින් අතාත්ත්වික ප්‍රතිබිම්බයක් නිරීක්ෂණය කරනු ලබයි. තල දර්පණයක් භාවිතයෙන් මෙම අතාත්ත්වික ප්‍රතිබිම්බයේ පිහිටීම සෙවීමට ඔහු තීරණය කළේ ය. ඔහු මේ සඳහා තල දර්පණය සහ $Y$ අල්පෙනෙත්ත තැබිය යුත්තේ කොයේ දැයි 1 රූපයේ ඇඳ පෙන්වන්න. තල දර්පණය $M$ ලෙස ද $Y$ හි නව පිහිටීම $Y'$ ලෙස ද නම් කරන්න.



Scanned by CamScanner




1 රූපය

$I$ ධාරාවක් රැගෙන යන සෘජු කම්බියක් 1 රූපයෙහි පෙන්වා ඇති පරිදි ප්‍රාව ඝනත්වය $B$ වූ ඒකාකාර චුම්බක ක්ෂේත්‍රයක තබා ඇත. චුම්බක ක්ෂේත්‍රයේ සහ ධාරාවේ දිශා අතර කෝණය $\theta$ වේ.

(*a*) (i) කම්බියෙහි $l$ දිගක් මත ක්‍රියාකරන $F$ චුම්බක බලයෙහි විශාලත්වය සඳහා ප්‍රකාශනයක් $I$, $B$, $l$ හා $\theta$ ඇසුරෙන් ලියන්න.

$F = B I L \sin\theta$

(ii) චුම්බක බලයෙහි දිශාව දෙනු ලබන නීතිය ලියා දක්වන්න. ($\theta = 90°$ අවස්ථාව සඳහා)

වම් අතේ මැද ඇඟිල්ල, දබර ඇඟිල්ල හා මාපට ඇඟිල්ල එකිනෙකට ලම්බකව තබාගත් විට මැද ඇඟිල්ල ධාරාවේ දිශාවටද, දබර ඇඟිල්ල චුම්බක ක්ෂේත්‍රයේ දිශාවටද එල්ල කළ විට මාපට ඇඟිල්ලේ දිශාවෙන් චුම්බක බලයේ දිශාව ලැබේ.

(*b*) දන් ඉහත කම්බිය, දිග $a$ වූ ද පළල $b$ වූ ද පොට $N$ සංඛ්‍යාවක් සහිත සෘජුකෝණාස්‍රාකාර $PQRS$ දඟරයක් සැදෙන සේ නමනු ලැබේ. මෙම දඟරය ප්‍රාව ඝනත්වය $B$ වූ ඒකාකාර චුම්බක ක්ෂේත්‍රයක 2 රූපයෙහි දක්වා ඇති පරිදි තබනු ලැබේ. දඟරයෙහි තලය හා $B$ හි දිශාව අතර කෝණය $\alpha$ වේ. දඟරය තුළින් $I$ ධාරාවක් යවනු ලැබේ.




2 රූපය

(i) 2 රූපයෙහි දක්වා ඇති මොහොතේ දී දඟරයේ $PS$ හා $QR$ බාහු මත ක්‍රියාකරන චුම්බක බල සඳහා ප්‍රකාශන ලියා, එනයින් දඟරය මත ඇතිවන බල යුග්මයේ විශාලත්වය සඳහා ප්‍රකාශනයක් $N, I, B, \alpha$, සහ දඟරයේ ක්ෂේත්‍රඵලය $A$ ඇසුරෙන් ව්‍යුත්පන්න කරන්න.

PS මත ඇති චුම්බක බලය $= B I N a$

QR මත ඇති චුම්බක බලය $= B I N a$

බල යුග්මය $= B I N a \times b \cos\alpha = B I N A \cos\alpha$

(ii) $PQ$ හා $RS$ බාහු මත චුම්බක බල නිසා ඇතිවන යුග්මය ශූන්‍ය වේ. මෙයට හේතුව පැහැදිලි කරන්න.

PQ හා RS මත ක්‍රියා කරන බල සමාන හා ප්‍රතිවිරුද්ධ වන අතර ඒවා එකම රේඛාවේ ක්‍රියා කරයි./ ඒවා අතර ලම්බ දුරක් නැත.



Scanned by CamScanner

(c) සල දඟර ගැල්වනෝමීටරයක දළ රූප සටහනක් 3 රූපයේ දක්වා ඇති අතර එහි චුම්බක ක්ෂේත්‍රය පෙන්වා නැත.




(i) ඉහත $b$ (i) හි සඳහන් කළ බල යුග්මය, $\alpha$ මත රඳ පැවතීම මෙම උපකරණයෙහි මගහැර ගෙන ඇත්තේ කෙසේ ද?

දඟරය අරීය චුම්බක ක්ෂේත්‍රයක තබා ඇති නිසා දඟරයේ ඕනෑම පිහිටුමකදී එහි තලය චුම්බක ක්ෂේත්‍රයේ දිශාවට පිහිටයි. එමනිසා $\alpha = 0 \Longrightarrow \cos\alpha = 1$

(ii) ගැල්වනෝමීටර දඟරයට $N$ පොටවල් සංඛ්‍යාවක් හා $A$ ක්ෂේත්‍රඵලයක් ඇත. චුම්බක ක්ෂේත්‍රයෙහි ස්‍රාව ඝනත්වය $B$ වන අතර සර්පිල දුන්නෙහි ව්‍යාවර්තන නියතය $C$ වේ. ගැල්වනෝමීටරය තුළින් $I$ ධාරාවක් ගලන විට දර්ශකයෙහි උත්ක්‍රමය $\theta$ වේ.

$I$ හා $\theta$ අතර සම්බන්ධය දක්වන ප්‍රකාශනයක් ලියා දක්වන්න.

$NIBA = C\theta$

(iii) මෙම ගැල්වනෝමීටරයට 5 mA පූර්ණ පරිමාණ උත්ක්‍රමයක් ඇත. මෙම උපකරණය, 5 A පූර්ණ පරිමාණ උත්ක්‍රමයක් දක්වන ඇමීටරයක් බවට පරිවර්තනය කිරීම සඳහා ඔබ බාහිර ප්‍රතිරෝධකයක් සම්බන්ධ කරන්නේ කෙසේ ද?

කුඩා ප්‍රතිරෝධයක් සහිත ප්‍රතිරෝධකයක් ගැල්වනෝමීටරය හා සමාන්තරගතව සම්බන්ධ කළ යුතුය.
උප පථයක් හෝ




(iv) ගැල්වනෝමීටර දඟරයේ ප්‍රතිරෝධය 20 Ω නම් $c$ (iii) හි දී අවශ්‍ය වන ප්‍රතිරෝධකයේ අගය ගණනය කරන්න.

$20 \times 5 \times 10^{-3} = R \times 4995 \times 10^{-3}$

$R = 0.02\ \Omega$

(v) $\mu A$ පරාසයේ වූ ධාරා මැනීම සඳහා මෙම උපකරණය අභ්‍යන්තර ව විකරණය කිරීම සඳහා ක්‍රමයක් යෝජනා කරන්න.

දඟරයේ වට සංඛ්‍යාව වැඩි කිරීම / අරීය චුම්බක ක්ෂේත්‍රය වැඩි කිරීමෙන්

අවලම්බිත කම්බියේ ව්‍යාවර්ත නියතය කුඩා කිරීමෙන් / දඟරයේ වර්ගඵලය වැඩි කිරීමෙන්



Scanned by CamScanner

01. B - වර්නියර් පරිමාණය ලෙස කිසිවිටෙකත් සඳහන් නොකළ යුතුය. මයික්‍රෝමීටර් ආමානයේ වර්නියර් මූලධර්මය අනුව සැකසූ උපකරණයක් නොවේ. එය වෘත්තාකාර පරිමාණය වේ. A සඳහා ඊතලය එල්ල විය යුතුව තිබුනේ ප්‍රධාන පරිමාණයටය. මෙම ප්‍රශ්නය සරළ ප්‍රශ්නයකි. ඉස්කුරුප්පු ආමානයේ මූලික කරුණු පරීක්ෂා කෙරේ. භාගික දෝෂය සඳහන් කරන විට කුඩාම මිනුම හෝ කුඩාම මිනුමේ හරි අඩක් ගත හැක. මා පෙර සඳහන් කර පරිදි (පසුගිය වසරේ) මිනුමක් ප්‍රකාශ කරන විට (+ හෝ - ලකුණු සහිතව) කුඩාම මිනුමේ හරි අඩ ගත්තත් භාගික දෝෂය හෝ ප්‍රතිශත දෝෂය සඳහා කුඩාම මිනුම යොදා ගැනීම සාමාන්‍ය සිරිතය.
$d_2$ මැන ගැනීම සඳහා මයික්‍රෝමීටර ඉස්කුරුප්පු ආමානය යොදා ගැනීම වැරදිය. $d_1$ හා t මැන ගැනීම ඉස්කුරුප්පු ආමානය භාවිත කිරීම නිවැරදි වූ වත් $d_2$, සඳහා ව'නියර් කැලිපරය යොදාගත යුතුය. කෙසේ වෙතත් සාමාන්‍ය ඉස්කුරුප්පු ආමානයකින් 2.5 cm ට වඩා වැඩි පාඨාංක ලබා ගත නොහැක. පොලිතීන් කොලයක ඝනකම මැනීම සඳහා ක්‍රමයක් අසන විට මීට පෙර කාසි කිහිපයක ඝනකම මැන එමගින් එක් කාසියක ඝනකම ලබාගත් ක්‍රමය පෙර ප්‍රශ්නයක ඇති බව මතකයට ගත හැක.

02. ජල මට්ටම අඳින විට පරිස්සමින් කළ යුතුය. හෝල්ඩරය ස්පර්ශ නොකල යුතුය. ඊට හේතුව ලිවීමට අනවශ්‍යය. මිනුම් උපකරණයක් හැටියට විරාම ඝටිකාව අමතක විය හැක. අවසාන ප්‍රශ්නයේ අසන්නේ ඉතාම සරල දෙයක් වුවද බලාපොරොත්තු වන්නේ 'ලාම්පු ආවරණය පිළිස්සී යා හැක' වැනි සරල උත්තරයක් බව බොහෝ දෙනා තීරණය නොකරනු ඇත. (e) කොටසේ තාපය හානි විය හැකි විධි යන්නෙන් පරීක්ෂකවරුන් බලාපොරොත්තු වන්නට ඇත්තේ තාප හානිවන අන්දම (විධි ක්‍රම) වෙන්නට ඇත. නමුත් ප්‍රශ්නය අසා ඇති ආකාරයට සන්නයනය, සංවහනය වැනි උත්තරද නිවැරදි බවට බාර ගැනීමට සිදු විය.

03. ලකුණු අඩු වෙන්ම ලබාගෙන තිබූ ප්‍රශ්නය මෙය බවට අසන්නට ලැබුණි. මෙම පරීක්ෂණය ඉතාම පහසුවෙන් පාසැල් විද්‍යාගාරයේ කළ හැකි නිසා ලකුණු අඩුවීම තේරුම් ගැනීමට අපහසුය. X හි පතිබිම්භය Y හි පිහිටීමේ සෑදී නොමැති විට හෝ ඇති විට ඔබට පෙනෙනුයේ කුමක් ද ? යන ප්‍රශ්නයට නිකම් ම නිකං අසම්පාත වේ යැයි හා සමපාත වේ යන උත්තරවලට ලකුණු නොලැබේ. මෙම පරීක්ෂණය කලා නම් ඇත්තටම සිදුවන දේ ලස්සනට ඇස්වලින් බලා ගත හැක. ඕනෑම අවස්ථාවකදී ප්‍රධාන අක්ෂය ඔස්සේ බලන විට ප්‍රතිබිම්බය හා Y සමපාත වන බව පෙනේ. දෙදෙනා හරියටම එකතැන තිබේදැයි බැලීමට නම් ඇස ප්‍රධාන අක්ෂයට ලම්බව හා තිරස්ව එහා මෙහා ගෙන යා යුතුය. හරියටම පිහිටුම් සමාන නම් පමණක් මෙසේ ඇස එහා මෙහා ගෙන යන විට දෙදෙනාම හරි ලස්සනට එකට චලනය වන බව පෙනේ.




A හා B එකම තැන නොවේ නම් ඇස චලනය කරන විට B, A ට වඩා ඇසට සමීප නිසා B, A ට සාපේක්ෂව වැඩියෙන් චලනය වන බව පෙනේ. A හා B දෙකම එකම තැන ඇත්නම් පමණක් A හා B එකිනෙකට සාපේක්ෂ චලිතයක් නොමැතිව චලනය වේ. ඇස චලනය නොකළහොත් A හා B එකම තැන නොතිබේද, තිබේද ක්‍රියා තීරණය කළ නොහැක.
ප්‍රස්ථාරයේ අක්ෂ නාම් කිරීමේදී ඒකකය බොහෝවිට අමතක විය හැක. එය $cm^{-1}$ වේ. f සෙවීමට නම් ප්‍රස්ථාරය $^1/_V$ අක්ෂය හෝ $^1/_U$ අක්ෂය කැපෙන තෙක් දික් කළ යුතුය.

(e) කොටස නම් අසීරුය. විශේෂයෙන් තල දර්පණයක් භාවිතයෙන් අතාත්වික ප්‍රතිබිම්බයක පිහිටීම නිර්ණය කිරීමේ පරීක්ෂණය, පරීක්ෂණ ලයිස්තුවේ නැත. එමනිසා ඉතාම බුද්ධිමත් දරුවෙකුට හෝ "පොට්ටෙ" හරියන දරුවෙකුට හැර මෙයට උත්තර සෙවීම අපහසුය. අතාත්වික ප්‍රතිබිම්බය, තාත්වික ප්‍රතිබිම්බය නිර්ණය කරන ආකාරයට Y අල්පෙනෙත්ත පෙර පරිදි තැබීමෙන් කළ නොහැක. කාචය තුළින් බලන විට X හි අතාත්වික ප්‍රතිබිම්බයක් X ට පිටුපසින් සෑදේ. එමනිසා එහි පිහිටීම නිර්ණය කිරීමට නම් තල දර්පණ තුළ පෙනෙන Y හි අතාත්වික ප්‍රතිබිම්බය එය හා සමපාත කල යුතුය. දැන් ඇස Y ට පිටුපසින් තැබූ විට කාචය තුළ X හි අතාත්වික ප්‍රතිබිම්බය හා තල දර්පණය මගින් සෑදෙන Y හි අතාත්වික ප්‍රතිබිම්බය පෙනේ. තල දර්පණය හෝ/හා Y සීරුමාරු කිරීමෙන් මෙම ප්‍රතිබිම්බ දෙකම එකම තැනකට ගත හැක.

04. මෙය theory ප්‍රශ්නයකි. PQ හා RS බාහු මත ඇතිවන යුග්මය ශූන්‍ය වේ යන්නට හේතුව බල දෙක සමාන යන්න ලිවීම අසම්පූර්ණය. යුග්මය ශූන්‍ය වීමට බල දෙක එකම රේඛාව මත පිහිටිය යුතුය හෝ ලම්බ දුර ශූන්‍ය විය යුතුය. අරීය චුම්බක ක්ෂේත්‍ර කථාව කිහිප විටක් ම පරීක්ෂා කර ඇත.



Scanned by CamScanner

## B කොටස - රචනා

ප්‍රශ්න හතරකට පමණක් පිළිතුරු සපයන්න.

($g = 10\ \mathrm{N\ kg^{-1}}$)

---

1. ස්කන්ධය 0·1 kg වූ කුඩා බෝලයක් $t = 0$ දී තිරස් පොළවක් මතට නිශ්චලතාවේ සිට අතහරිනු ලැබේ. බෝලය ආරම්භයේ දී පොළවේ සිට $H$ උසකින් තිබූ අතර සෑම එක් එක් ගැටුමක දී ම එය සිරස් ව පොළාපනී. බෝලයේ ප්‍රවේග ($v$) - කාල ($t$) ප්‍රස්තාරයේ කොටසක් රූපයෙහි දක්වේ.




(i) වාත ප්‍රතිරෝධය සහ උඩුකුරු තෙරපුම නොසලකා හරිමින්, බෝලය සඳහා පහත සඳහන් දෑ ගණනය කරන්න.

(a) ආරම්භක උස $H$.

(b) පළමු ගැටුමේ දී බෝලයේ ගම්‍යතාවේ වෙනස්වීම සහ පොළවට සංක්‍රාමණය වූ ගම්‍යතාව.

(c) දෙවැනි ගැටුම සිදුවන විට $t$ හි අගය.

(ii) බෝලය සහ පොළව අතර ගැටුම පූර්ණ ප්‍රත්‍යාස්ථ නම් මෙම චලිතය සඳහා $v$-$t$ ප්‍රස්තාරය අඳින්න.

(iii) පැත්තක දිග 1 m වූ ඝනකාකාර හිස් පෙට්ටියක් තුළ, ස්කන්ධය $6 \times 10^{-26}$ kg වූ අංශුවක් පෙට්ටියේ ප්‍රතිවිරුද්ධ බිත්ති දෙකක් සමග අභිලම්බ ව ගැටෙමින් ඉදිරියට සහ පසුපසට චලිතවීමට සලස්වනු ලැබේ. අංශුව හා බිත්ති අතර ගැටුම් පූර්ණ ප්‍රත්‍යාස්ථ වන අතර අංශුවෙහි වේගය $2 \times 10^{3}\ \mathrm{m\ s^{-1}}$ වේ. (අංශුව මත ගුරුත්ව බලය නොසලකා හැරිය හැකි යැයි උපකල්පනය කරන්න.)

(a) අංශුව බිත්ති දෙකෙන් එක් බිත්තියක් සමග ගැටෙන සීඝ්‍රතාව ගණනය කරන්න.

(b) අංශුව විසින් එම බිත්තියට ගම්‍යතාව සංක්‍රාමණය කරනු ලබන සීඝ්‍රතාව කුමක් ද?

(c) පෙට්ටිය තුළ ඉහත සඳහන් චලිතය ම සිදුකරන අංශු $2 \times 10^{23}$ සංඛ්‍යාවක් ඇතැයි සිතන්න. මෙම අංශු එකිනෙක අතර ගැටුම් සිදු නොකරන අතර බිත්ති සමග ඒවායේ ගැටුම්, බිත්තියේ ක්ෂේත්‍රඵලය පුරා ඒකාකාර ව ව්‍යාප්ත වී ඇති බව ද සලකන්න.

බිත්ති දෙකෙන් එකක් මත අංශු මගින් ඇතිකරනු ලබන පීඩනය ගණනය කරන්න.

2. පහත සඳහන් ඡේදය සැලකිල්ලෙන් කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

සංගීත ස්වර ඇතුළු ඕනෑම ශබ්දයක ප්‍රභවය, කම්පනය වන වස්තුවකි. ශබ්දයකට ආවේණික ගුණය එහි හඬේ සැර සහ තාරතාව මගින් ද ධ්වනි ගුණය නම් වූ තවත් තුන්වන ගුණයකින් ද නිර්ණය වේ. ධ්වනි ගුණය, අපට, දෙන ලද වර්ගයක සංගීත භාණ්ඩයක් අනෙක් ඒවායෙන් වෙන්කොට හඳුනාගැනීමට සලස්වයි. උදාහරණයක් වශයෙන්, වයලීනයක් හා බට නළාවක් මගින් එක ම හඬේ සැර හා තාරතාව සහිත ස්වරයක් වෙන වෙන ම වාදනය කෙරෙන විට ඇසෙන ශබ්ද දෙක අතර පැහැදිලි වෙනසක් ඇත. මෙසේ වන්නේ මෙම උපකරණ දෙකෙහි ඇති ධ්වනි ගුණයේ වෙනස නිසා ය. හඬේ සැර සහ තාරතාව, ධ්වනි තරංගයක මිනිය හැකි භෞතික රාශීන් සහ සම්බන්ධ කළ හැකි වා සේ ම ධ්වනි ගුණය ද එසේ සම්බන්ධ කළ හැකි ය. සාමාන්‍යයෙන් සංගීත භාණ්ඩයකින් ස්වරයක් වාදනය කෙරෙන විට එම ශබ්දයෙහි මූලික සංඛ්‍යාතයට අමතර ව උපරිතාන ද පවතී. ධ්වනි ගුණය රඳා පවතින්නේ මෙම උපරිතාන සංඛ්‍යාව හා ඒවායේ සාපේක්ෂ විස්තාර මතයි.



Scanned by CamScanner




1 රූපය




2 රූපය




3 රූපය

වයලීනයක් මගින් නිපදවෙන ස්වරයක ශබ්ද රටාවක් 1 රූපයෙහි පෙන්වා ඇත. එයින් දක්වා ඇත්තේ මෙම උපකරණය නිපදවන ශබ්දයෙහි සම්පූර්ණ විස්තාරය කාලය සමග වෙනස් වන ආකාරයයි. 2 රූපයෙහි පෙන්වා ඇත්තේ මෙම ශබ්ද රටාවේ පවතින මූලිකය හා උපරිතානවල සංඛ්‍යාත ද ඒවායේ සාපේක්ෂ විස්තාර ද දෙන 'ෆූරියර් වර්ණාවලිය'යි. ශබ්ද රටාවේන් ෆූරියර් වර්ණාවලිය ජනනය කරනු ලබන්නේ ෆූරියර් විශ්ලේෂණය නම් වූ ගණිතමය ක්‍රමයක් භාවිත කිරීමෙනි. සංගීත ස්වර මෙන් නොව, සාමාන්‍යයෙන් ඝෝෂාවන් ලෙස හැඳින්වෙන ශබ්දවලට ඇත්තේ සංඛ්‍යාත එකිනෙකින් වෙන් වූ ෆූරියර් වර්ණාවලින් වෙනුවට සන්තතික බවට ඉතා ළං වූ වර්ණාවලින් ය.

අපට දක්නට ලැබෙන ඕනෑ ම සංගීත භාණ්ඩයකින් නිපදවන සංගීතය ප්‍රතිනිර්මාණය කළ හැකි ඉලෙක්ට්‍රෝනික ඕගන් වර්තමානයේ දකිය හැකි ය. මෙවැනි ප්‍රතිනිර්මාණ සඳහා පළමුව සංගීත ස්වරවල ෆූරියර් වර්ණාවලින් ලබා ගත යුතු ය. ඉන්පසු ෆූරියර් වර්ණාවලියේ ඇති සංඛ්‍යාත සහ ඒවාට අනුරූප සාපේක්ෂ විස්තාර සහිත විද්‍යුත් සංඥ මිශ්‍ර කිරීමෙන් එක් එක් ස්වරය සඳහා විද්‍යුත් තරංග රටාවක් ඉලෙක්ට්‍රෝනික තාක්ෂණය මගින් ලබාගත හැකි ය. පසුව මෙම විද්‍යුත් තරංග රටා ශබ්ද තරංග රටා බවට පරිවර්තනය කළ හැකි ය. මේ සියල්ල ම පරිපූර්ණත්වයට ඉතා ළං වන සේ සංඛ්‍යාංක තාක්ෂණය මගින් සිදුකළ හැකි ය.

සම්මත සංගීත භාණ්ඩවල, පහරදීමෙන්, පිඹීමෙන්, පෙලීමෙන් හෝ පිරිමැදීමෙන් ප්‍රභවයට කම්පනයක් ලබාදීම සිදුකෙරේ. බහුල ව පවතින සංගීත භාණ්ඩ අතරෙන්, පහරදෙන විට කම්පනය වන පටලයක් බෙරයට ඇත. බටනළාව සහ කාහලය (Trumpet) යන භාණ්ඩවල සංගීත ස්වර ඇති කිරීම සඳහා කම්පනය වන වාත කඳන් යොදා ගැනේ. දෙකෙළවර විවෘත ව ඇති බටයක් ලෙස බටනළාව සැලකිය හැකි ය. බටනළාව පිඹින විට එය තුළ ඇති වාත කඳ අනුනාද වේ.

වයලීනය, ගිටාරය සහ පියානෝව යන සියල්ලේ ම කම්පනය වන ඇදි තන්තු ඇත. ගිටාරයෙහි තන්තුවක කම්පනය වන දිග, ඇඟිලි මගින් වෙනස් කිරීමෙන් වෙනස් සංගීත ස්වර ලබාගන්නා අතර, අවශ්‍ය සියලු ම ස්වර නිපදවීම සඳහා එවැනි තන්තු කිහිපයක් ගිටාරයේ ඇත. පියානෝවෙහි එක් එක් ස්වරය සඳහා වෙන ම තන්තුව බැගින් ඇත. සාමාන්‍යයෙන්, සිහින් තන්තුවල යාන්ත්‍රික කම්පන මගින් කෙලින් ම ඇසීමට තරම් ප්‍රමාණවත් ශබ්ද ඇති නොකරයි. මේ නිසා තන්තු සහිත උපකරණවල ශබ්දය වර්ධනය කිරීම සඳහා ධ්වනි පෙට්ටියක් (පේටිකාවක්) යොදගනු ලැබේ (3 රූපය). තන්තු කම්පනය වීමට සැලැස්වූ විට ධ්වනි පෙට්ටිය වඩා ප්‍රබල ශබ්දයක් ඇති කරමින් එම ධ්වනි රටාව ම සහිත ව අනුනාද වෙයි. එනමුදු විද්‍යුත් ගිටාරවල තන්තුවක යාන්ත්‍රික කම්පනය විද්‍යුත් සංඥවක් බවට හරවා පසුව එය ඉලෙක්ට්‍රෝනිකව වර්ධනය කෙරේ.

(i) ශබ්දයක හඬේ සැර තීරණය වන්නේ ශබ්ද තරංගයෙහි කුමන භෞතික ගුණය මත ද?

(ii) ශබ්ද තරංගයක කුමන භෞතික ගුණය එහි තාරතාව හා සම්බන්ධ වේ ද?

(iii) 2 වන රූපයෙහි පෙන්වා ඇති, වයලීනයෙහි ෆූරියර් වර්ණාවලියේ මූලික සංඛ්‍යාතය $f_0$ හි අගය 400 Hz වේ.

(a) වයලීනය මගින් නිපදවන 3 වන උපරිතානයෙහි සංඛ්‍යාතය කුමක් ද?

(b) $\dfrac{\text{5 වන උපරිතානයෙහි විස්තාරය}}{\text{මූලික සංඛ්‍යාතයෙහි විස්තාරය}}$ හි අගය කුමක් ද?

(iv) සංගීත භාණ්ඩයක් මගින් නිපදවන ස්වරයක 420 Hz හි ඇති මූලික සංඛ්‍යාතයක් ද, එක් එක්හි විස්තාර මූලිකයෙහි විස්තාරයෙන් හරි අඩක් වන පළමුවන සහ දෙවන උපරිතාන ද ඇත. වෙනත් උපරිතාන නැතැයි උපකල්පනය කරමින් ස්වරයේ ෆූරියර් වර්ණාවලිය අඳින්න.

(v) ඉහත (iv) හි විස්තර කරන ලද ශබ්දය ඉලෙක්ට්‍රෝනික ව නිපදවීම සඳහා ගත යුතු පියවර සඳහන් කරන්න.

(vi) ඉලෙක්ට්‍රෝනික ගිටාරවල ධ්වනි පෙට්ටි නැත. මෙයට හේතුව දෙන්න.

(vii) කම්පනය වන ඇදි තන්තුවක, තන්තුවේ දිග $l$, ආතතිය $T$, ඒකක දිගක ස්කන්ධය $m$ හා මූලික සංඛ්‍යාතය $f_0$ යන මේවා අතර සම්බන්ධතාව දක්වන ප්‍රකාශනයක් ලියන්න.

(viii) දිග 0·68 m වූ ගිටාර තන්තුවක්, ඇඟිලි නොයෙදූ විට 330 Hz මූලික සංඛ්‍යාතය සහිත ස්වරයක් වාදනය කිරීම සඳහා සුසර කර ඇත. මූලික සංඛ්‍යාතය 440 Hz වූ ස්වරයක් වාදනය කිරීම පිණිස තන්තු කෙළවරේ සිට කුමන දුරකින් ඇඟිල්ල තැබිය යුතු ද?

(ix) බටනළාවක්, 27 °C උෂ්ණත්වයේ දී සියලු ම සිදුරු වසා වාදනය කළ විට 262 Hz මූලික සංඛ්‍යාතය සහිත ස්වරයක් ලැබෙන අන්දමට නිර්මාණය කර ඇත.

(a) 27 °C දී වාතයේ ධ්වනි වේගය 340 m $s^{-1}$ නම් බටනළාවෙහි දිග ආසන්න වශයෙන් ගණනය කරන්න.

(b) පරිසරයේ උෂ්ණත්වය −30 °C වූ ස්ථානයක, සියලු ම සිදුරු වසා මෙම බටනළාව වාදනය කළේ නම් ශබ්දයෙහි මූලික සංඛ්‍යාතය කුමක් ද?



Scanned by CamScanner

3. ස්කන්ධය $m$ ද ආරෝපණය $+q$ ද වූ අංශුවක් විද්‍යුත් ක්ෂේත්‍රය ශූන්‍ය වූ රික්තයක් තුළ ධන $x$ දිශාව ඔස්සේ චලනය වෙමින් පවතී. මෙම අංශුව ඉන් පසුව 1 රූපයේ පෙන්වා ඇති පරිදි, විශාල ප්‍රදේශයක පැතිරී පවතින, තීව්‍රතාව $E$ වූ ඒකාකාර විද්‍යුත් ක්ෂේත්‍රයක් තුළට $x = 0$ දී $v$ ප්‍රවේගයකින් ඇතුළු වේ. විද්‍යුත් ක්ෂේත්‍රය සෘණ $x$ දිශාව ඔස්සේ එල්ල වී ඇත. විද්‍යුත් ක්ෂේත්‍රයට ඇතුළු වූ පසු අංශුවේ චලිතය ගුණාත්මක ව විස්තර කරන්න. (ගුරුත්වය නිසා ඇති වන බලපෑම් නොසලකා හරින්න.)




1 රූපය

2 රූපයේ පෙන්වා ඇති පරිදි එකිනෙකෙහි ස්කන්ධය $m$ සහ ආරෝපණය $+q$ වූ $P$ සහ $Q$ අංශු දෙකක් කාලය $t = 0$ දී පිළිවෙළින් $v_1$ සහ $v_2$ ආරම්භක ප්‍රවේගවලින් $x = 0$ ට අනුරූප ලක්ෂ්‍ය දෙකකින් ධන $x$ දිශාව ඔස්සේ රික්තයක් තුළ එකවිට චලිතය අරඹයි. $(v_1 > v_2)$




2 රූපය

(i) මෙම අංශු දෙක $x = 0$ සිට $x = L$ දක්වා ක්ෂේත්‍ර රහිත ප්‍රදේශයක ගමන් කරයි නම් වඩා වේගයෙන් ගමන් කරන අංශුව $x = L$ කරා ළඟාවන මොහොතේ දී අංශු දෙක අතර පරතරය $d$ සඳහා ප්‍රකාශනයක් ලබාගන්න.

